NEW

08 | S | I, II

# 2566 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2022

(නව නිර්දේශය)

## (08) සමාජ විද්‍යාව - I, II

## සමාජ විද්‍යාව - II පත්‍රය

* පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක්ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයනන්න.

(01)

(i) 'සමාජ ස්ථිතිකත්වය හා ගතිකත්වය" යන්නෙහි සරල අදහස ලියන්න.

(ii) යාන්ත්‍රික ඒකාබද්ධතාව සහිත සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.

(iii) කාල් මාක්ස් දැක්වූ සමාජ පරිණාමයේ අවධි අතර පන්ති විරහිත සමාජ ක්‍රමයක් ක්‍රියාත්මක වූ අවධි දෙකක් නම් කරන්න.

(iv) සමාජ නවීකරණය කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක දෙකක් නම් කරන්න.

(v) ශ්‍රී ලාංකේය සමාජයේ දක්නට ලැබෙන ප්‍රධාන සංස්කෘතීන් දෙකක් නම් කරන්න.

(vi) ශ්‍රී ලාංකේය සමාජයේ දක්නට ලැබෙන පවුල් වර්ග දෙකක් සඳහන් කරන්න.

(vii) ශ්‍රී ලාංවේ පැරණි සමාජය තුළ සමාජ විරෝධි ක්‍රියාවන්හි නිරත වූ පුද්ගලයින්ට එරෙහිව ප්‍රාදේශිය පාලකයින් විසින් ක්‍රියාත්මක කරන ලද දණ්ඩන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(viii) සමාජ විරෝධී ක්‍රියාවන්හි නිරත තරුණ වරදකරුවන් රඳවා තබන විශෝධන මධ්‍යස්ථාන දෙකක් නම් කරන්න.

(ix) සමාජ ප්‍රශ්නයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

(x) සමාජ විද්‍යාත්මක පර්යේෂණයකදී දත්ත ලබාගත හැකි ප්‍රධාන මූලාශ්‍ර දෙක නම් කරන්න.

(ලකුණු 2 x 10 =20)

(02)

(i) බුදු දහමේ සමාජ විද්‍යාත්මක පදනම පිළිබඳ අධ්‍යයනය කළ ශ්‍රී ලාංකේය සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) සමාජ සංස්ථාවන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) බෞද්ධ භික්ෂූන් වහන්සේට සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන කරුණු දෙකක් ඔස්සේ පැහැදිළි කරන්න. (ලකුණු 05)

(03)

(i) ඔගස්ට් කොම්ට්ට අනුව දේවවාදී සමාජ අවධිය තුළ සමාජයේ දක්නට ලැබුණු ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) මැක්ස් වේබර්ට අනුව නෛතික ආධිපත්‍ය සහිත සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලාංකේය සමාජය වෙනස්වීම කෙරෙහි බලපෑ සමාජයානුබද්ධ සාධක දෙකක් විස්තර කරන්න.

(ලකුණු 05)

www.pirivena.lk

(04)

(i) සංස්කෘතික විසරණය කෙරෙහි බලපෑම් කරන ප්‍රධාන සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) භෞතික සංස්කෘතිය නිරූපණය කරන අංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii)විස්තෘත පවුල් සංස්ථාව තුළ පවතින සමාජ විද්‍යාත්මක අගය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05)

(i) ශ්‍රී ලාංකා සමාජ පරිණාමය අධ්‍යනය කළ හැකි ප්‍රධාන අංශ දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) බෞද්ධ භික්ෂුභාවය ලබා ගැනීමේ මූලික අරමුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii)ස්වයං ශික්ෂණයක් ගොඩනගා ගැනීම සඳහා බුදු දහමේ එන ඉගැන්වීම් යොදාගත හැකි බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(06)

(i) සමාජ පාලනයේදී යොදා ගත හැකි අවිධිමත් සමාජ පාලන අංශ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) 1998 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 105 වන වගන්තියට අනුව පිහිටුවා ඇති ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලතල තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii)සම්ප්‍රදායික ආධිපත්‍ය පැවති සමාජයක ලක්‍ෂණ දෙකක් නිදසුන් සහිතව පැහැදිළි කරන්න. (ලකුණු 05)

(07)

(i) අපරාධ චර්යාවන් පුද්ගළයා තුළ වර්ධනය වීම කෙරෙහි බලපාන සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ජන වර්ගයක් හඳුනා ගැනීමට උපයෝගී වන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii)ජන වර්ගයන් අතර ඒකාබද්ධතාවයක් ගොඩනගා ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් යොදාගත හැකි බව නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(08)

(i) සමාජ විද්‍යා පර්යේෂණයකින් ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සමාජීය විද්‍යා පර්යේෂණයකදී තොරතුරු ලබාගැනීම සඳහා යොදාගන්නා නිරීක්ෂණ ප්‍රභේද තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii)සමාජීය විද්‍යා පර්යේෂණයක මූලික පියවරයන් කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05)

* * *

www.pirivena.lk

NEW

# 2566 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2022

| 08 | S | I, II |
|---|---|---|

(නව නිර්දේශය)

## (08) සමාජ විද්‍යාව - I, II

## සමාජ විද්‍යාව - II පත්‍රය

* පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක්ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයනන්න.

(01)

(i) සමාජ විද්‍යාව විෂය වර්ධනය සඳහා මැක්ස් වේබර් විසින් හඳුන්වා දුන් මූලික සංකල්ප දෙකක් ලියන්න.

(ii) සමාජ ගතිකත්වය පිළිබඳ සිද්ධාන්තය මූලික වශයෙන් දැක්වෙන බෞද්ධ සූත්‍ර දෙකක් නම් කරන්න.

(iii) සමාජ විද්‍යාව ආරම්භක අවධියේදී ජීවත් වූ ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න.

(iv) එමිල් ඩුර්කයිම් විසින් සරල සමාජ සංකීර්ණ අවධියකට පරිණාමය වීම කෙරෙහි බලපාන බව පෙන්වා දුන් ප්‍රධාන සංකල්ප දෙක සඳහන් කරන්න.

(v) පුනරුද සමයේදී කතෝලික පල්ලියේ ආධිපත්‍යට එරෙහිව අදහස් ඉදිරිපත් කළ පූජකවරු දෙදෙනාගේ නම් ලියන්න.

(vi) ශ්‍රී ලංකා සමාජයේ දක්නට ලැබෙන ප්‍රධාන සංස්කෘතීන් දෙකක් නම් කරන්න.

(vii) මාග්‍රට් මීඩ් හා රූත් බෙනඩික්ට් යන සමාජ හා මානව විද්‍යාඥයින් සමාජානුයෝජනය සම්බන්ධයෙන් පර්යේෂණයට යොදාගත් සමාජ දෙක සඳහන් කරන්න.

(viii) වසල සූත්‍රය මඟින් පෙන්වා දෙන පරිදි පුද්ගලයෙකුට හිමිවන ප්‍රධාන සමාජ තත්ත්ව දෙක නම් කරන්න.

(ix) සමාජ විරෝධී ක්‍රියාවන්හි නිරතවූවන් බන්ධනාගාර ගත කිරීමෙන් අපේක්ෂිත ප්‍රධාන අරමුණු දෙකක් නම් කරන්න.

(x) බෞද්ධ සමාජ සංස්ථාව තුළ ශ්‍රාවක පිරිස වර්ග කළ හැකි ප්‍රධාන කාණ්ඩ දෙක ලියන්න.

(ලකුණු 2 x 10 =20)

(02)

(i) එමිල් ඩුර්කයිම් විසින් රචනා කළ සමාජ විද්‍යාත්මක කෘතීන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔගස්ට් කොම්ට් විසින් හඳුන්වා දුන් මානව සමාජ ප්‍රගමනයේ ප්‍රගති අවස්ථා තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) සමාජ විද්‍යාව යනු කුමක්දැයි නිර්වචන දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03)

(i) හර්බට් ස්පෙන්සර්ට අනුව 'රණකාමී සමාජය" තුළ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) මැක්ස් වේබර් විසින් හඳුන්වාදුන් ආධිපත්‍යයේ ආකාර තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) සමාජය දිගුකාලීනව වෙනස්වීම කෙරෙහි බලපෑම් කරන ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

www.pirivena.lk

(04)

(i) ප්‍රවාහන ක්ෂේත්‍රය නවීකරණය වීමේදී දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න . (ලකුණු 02)

(ii) සිංහල සාහිත්‍ය සන්දර්භය තුළ බණ කතා සාහිත්‍යාංගයට අයත් කෘතීන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii)බුදුදහම ශ්‍රී ලාංකීය සමාජයට ලැබීම හේතුවෙන් සමාජ පරිණාමය සිදු වූ ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(05)

(i) සංස්කෘතික ගැටුම තුළින් සමාජය තුළ නිර්මාණය වන ප්‍රබල ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පුද්ගලයෙකු සමාජගත කිරීමෙහිලා ප්‍රමුඛව ක්‍රියා කරන කාරකයන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii)සමාජ අනුකලනය කෙරෙහි ජනප්‍රිය බුදු දහම බලපාන ආකාරය ලක්ෂණ දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(06)

(i) ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය පාලන සංකල්ප අන්තර්ගත බෞද්ධ සූත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) අංගුත්තර නිකායේ ආධිපත්‍ය සූත්‍රය මඟින් දේශිත ආධිපත්‍ය සංකල්ප තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii)සමාජ පාලනය උදෙසා බෞද්ධ පංචශීලයේ එන සංකල්ප යොදාගත හැකි බව කරුණු දෙකක් ඇසුරින් ඇගයීමක් කරන්න. (ලකුණු 05)

(07)

(i) සමාජ ගැටලුවක් යනු කුමක්ද?

(ii) නූතන සමාජයේදී ඔබට හඳුනාගත හැකි ප්‍රබල සමාජ ගැටලු තුනක් නම් කරන්න. (ලකුණු 02)

(iii)සමාජ සම්බන්ධතා කෙරෙහි පංචනීවරණ ධර්ම බලපෑම් කරන අයුරු කරුණු දෙකක් ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 03) (ලකුණු 05)

(08)

(i) සමාජ විද්‍යා පර්යේෂණයක් යනු කුමක්ද? (ලකුණු 02)

(ii) සමාජ විද්‍යා පර්යේෂණයක දත්ත ලබාගැනීමේදී පර්යේෂකයාට මුහුණ දීමට සිදුවන ගැටලු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii)සමාජ විද්‍යා පර්යේෂණයක වැදගත්කම කරුණු දෙකක් ඔස්සේ පැහැදිළි කරන්න. (ලකුණු 05)

* * *

www.pirivena.lk

# 2566 - මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය - 2022 ජූලි

| 08 | S | I, II |
|---|---|---|

## 05 ශ්‍රේණිය

## (8) සමාජ විද්‍යාව - I, II

## සමාජ විද්‍යාව - II පත්‍රය

- පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක්ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1)

(i) ඕනෑම විෂය ක්ෂේත්‍රයක් මූලික වශයෙන් වර්ග කළ හැකි ප්‍රධාන ආකාර දෙක ලියන්න.

(ii) වෙබේරියානු සමාජ විද්‍යාව හඳුන්වාදුන් සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා අවධානයට බඳුන් කළ ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න.

(iii) සමාජ විද්‍යාඥයෙකුගේ හා ඔබගේ නිර්වචනයන් ඇසුරින් සමාජ විද්‍යාව යනු කුමක්දැයි අර්ථකථනය කරන්න.

(iv) වර්තමානයේ මානව පවුලක හඳුනාගත හැකි ප්‍රශ්න දෙකක් සඳහන් කරන්න.

(v) කොරෝනා (Covid-19) රෝගයේ රෝග ලක්ෂණයක් හා එම රෝගයෙන් වැළකීමට ඔබ අනුගමනය කරන පියවරක් සඳහන් කරන්න.

(vi) බෞද්ධ සමාජ විද්‍යාවේ හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණ දෙක නම් කරන්න.

(vii) පුද්ගලයෙකු දරිද්‍රතාවට පත්වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙකක් ලියන්න.

(viii) එමිල් ඩුර්කයිම් විසින් පෙන්වා දුන් සරල සමාජ සංකීර්ණ සමාජ දක්වා පරිණාමය වීමට බලපාන ප්‍රධාන සාධක දෙක නම් කරන්න.

(ix) හර්බට් ස්පෙන්සර් ට අනුව රණකාමී සමාජය තුළ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.

(x) සමාජ පරිණාමය පිළිබඳ අදහස් දැක්වූ කාල් මාක්ස්ට අනුව සමාජ පරිණාමයේ ප්‍රධාන න්‍යායන් දෙක නම් කරන්න.

(ලකුණු 02 x 10 = 20 යි.)

2)

(i) සම්භාව්‍ය සමාජ විද්‍යාවේ වර්ධනයට දායකත්වය ලබාදුන් ජර්මන් ජාතික සමාජ විද්‍යාඥයන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) බුදුදහම තුළ ඉගැන්වෙන පරිණාම සංකල්ප තුන නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයට අනුව සමාජ පරිණාමය වූ ආකාරය අවධි දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

3)

(i) පුද්ගල අන්තර් සම්බන්ධතා පවත්වාගෙන යන සමාජ සංස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) වෙනස් වීමේ ක්‍රියාවලිය සිදුවන ප්‍රධාන ආකාර තුන සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(iii) කෙටිකාලීනව සමාජය වෙනස් වීම කෙරෙහි බලපාන සාධක දෙකක් ඔස්සේ සමාජ වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)



www.pirivena.lk

4)

(i) නවීකරණය තුළින් සමාජය තුළ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02 යි.)

(ii) ශ්‍රී ලාංකීය සමාජය තුළ දක්නට ලැබෙන ප්‍රධාන සංස්කෘතීන් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) බුදුදහම ලැබීම හේතුවෙන් මෙරට ජන සමාජය තුළ සිදු වූ වෙනස්කම් ක්ෂේත්‍ර දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

5)

(i) දේවානම්පියතිස්ස රජුගෙන් අනුබුදු මිහිඳු හිමි සිදුකළ බුද්ධි පරීක්ෂණයේ ක්ෂේත්‍ර දෙක නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) දහම් කතා සාහිත්‍යය තුළ අපට හමුවන විශිෂ්ට දහම් කතා කෘති තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) සමාජ විසංවිධානකාරී බවින් තොරව තුලනය කිරීම උදෙසා චක්කවත්තිසීහනාද සූත්‍රයේ එන සාධක දෙකක් යොදා ගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

6)

(i) සංස්කෘතිය යනු කුමක්දැයි ඔබේ වචනයෙන් ලියන්න. (ලකුණු 02 යි.)

(ii) මෙරට මුල් පදිංචිකරුවන්ගේ (ආදිවාසීන්) ආගමික ඇදහිලි තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(iii) සමාජ පාලනයේ දී හින්දු සංස්කෘතියේ එන සදාචාරාත්මක ඉගැන්වීම් යොදාගත හැකි ආකාරය ක්ෂේත්‍ර දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

7)

(i) මානව සමාජයක් යනු කුමක්දැයි ඔබගේ වචනයෙන් ලියන්න. (ලකුණු 02 යි.)

(ii) නාගරික ජන සමාජයේ දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03 යි.)

(iii) කතෝලික ආගමේ ඉගැන්වෙන දස පනතෙහි සඳහන් කරුණු දෙකක් ඇසුරින් ඒවා සමාජ ප්‍රශ්න අවම කිරීමට හේතු වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

8)

(i) නූතන සමාජයේ දක්නට ලැබෙන ප්‍රබල සමාජ ප්‍රශ්න දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ලංකා සමාජයේ සියදිවි නසා ගැනීමට තුඩුදෙන හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(iii) සමාජ විද්‍යා පර්යේෂණයක දී දත්ත රැස් කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රම දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

* * *



www.pirivena.lk

NEW

# 2565 - මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2022

| 08 | S | I, II |
|---|---|---|

(නව නිර්දේශය)

පැ තුනයි

## 05 ශ්‍රේණිය

## (08) සමාජ විද්‍යාව - I, II

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සමාජ විද්‍යාව 1 පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **01** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් වඩාත් **නිවැරැදි හෝ වඩාත් ගැළපෙන** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න.

(ලකුණු 01×40=40 යි)

(1) සමාජ විද්‍යාව විෂය සමාජගත කිරීමට දායකත්වයක් ලබාදුන් සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා වන්නේ,

(1) එමිල් ඩුර්කයිම් ය. (2) මැක්ස් වේබර් ය.

(3) ඔගස්ට් කොම්ට් ය. (4) හර්බට් ස්පෙන්සර් ය.

(2) "ගතිකත්වය" යන සංකල්පය තුළින් විස්තර කරනුයේ,

(1) සමාජය ප්‍රභවය වීමයි. (2) සමාජ පැවැත්මයි.

(3) සමාජ අපගාමීත්වයයි. (4) සමාජ වෙනස්වීමයි.

(3) සමාජ විද්‍යාව නම් වූ විෂය ධාරාව පිළිබඳ වඩාත්ම වැදගත් වන සාධකය ඇතුළත් වරණය තෝරන්න.

(1) දැනුමේ පරාසය හා උපයෝගීතාව අධ්‍යනය කිරීමට හැකි වීමයි.

(2) බහුවිධ සමාජය පිළිබඳව අධ්‍යනය කිරීමට හැකි වීමයි.

(3) සමාජ සමූහ පිළිබඳව අධ්‍යනය කිරීමට හැකි වීමයි.

(4) සමාජ ප්‍රශ්න පිළිබඳව අධ්‍යනය කිරීමට හැකි වීමයි.

(4) සමාජ ප්‍රභවය, විකාශය, පරිහානිය, රාජ්‍ය බිහිවීම, කුල ක්‍රමයේ ප්‍රභවය ආදී සංසිද්ධීන් පිළිබඳව ඉතා ගැඹුරින් විග්‍රහ කරන බෞද්ධ සූත්‍ර දේශනාව නම්,

(1) චක්කවත්තිසීහනාද සූත්‍රයයි. (2) අග්ගඤ්ඤ සූත්‍රයයි.

(3) ව්‍යග්ගපජ්ජ සූත්‍රයයි. (4) ඉන්ද්‍රක සූත්‍රයයි.

(5) පුද්ගලයා සමාජගත කිරීමෙහිලා ප්‍රධාන කාර්යභාරයක් සම්පූර්ණ කරන මූලික ආයතනය නම්,

(1) පාසලයි. (2) ආගමයි.

(3) මානව පවුලයි. (4) ජන මාධ්‍යයයි.

www.pirivena.lk

[2 වැනි පිටුව බලන්න.

(6) සමාජ විද්‍යාව (Sociology) යන පදය පළමුවෙන්ම භාවිතයට යොදාගන්නා ලද්දේ,

(1) 1738 වර්ෂයේදීය.
(2) 1783 වර්ෂයේදීය.
(3) 1838 වර්ෂයේදීය.
(4) 1883 වර්ෂයේදීය.

(7) "සමාජ විද්‍යාව සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳව අධ්‍යනය කරන විද්‍යාවයි." මෙම හැඳින්වීම සමාජගත කළේ කවුද?

(1) හර්බට් ස්පෙන්සර් ය.
(2) රොබට් පාර්ක් ය.
(3) කිංස්ලි ඩේවිස් ය.
(4) එමිල් ඩූර්කයිම් ය.

(8) මානව සමාජය විද්‍යාත්මක පදනමක් සහිතව වඩාත් ගැඹුරින් අධ්‍යනය කිරීමට උචිත විෂයය පථය නම්,

(1) සමාජ විද්‍යාවයි.
(2) ජීව විද්‍යාවයි.
(3) භෞතික විද්‍යාවයි.
(4) රසායන විද්‍යාවයි.

(9) සමාජීය විද්‍යා හා සම්බන්ධ උප විෂයය ක්ෂේත්‍ර කිහිපයක් 'අ' තීරුවේද එමගින් අධ්‍යනය කරනු ලබන විෂයය ක්ෂේත්‍රය 'ආ' තීරුවේද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. ඓතිහාසික සමාජ විද්‍යාව | A. මිනිසාගේ සමාජ ආර්ථික ක්‍රියාවලිය. |
| 2. සමාජ මනෝ විද්‍යාව | B. ප්‍රාථමික සමාජයේ මිනිසාගේ සමාජ සම්බන්ධතා ක්‍රියාවලිය. |
| 3. සමාජ ආර්ථික විද්‍යාව | C. මිනිසාගේ ඓතිහාසික සමාජ පසුබිම. |
| 4. සමාජ මානව විද්‍යාව | D. පුද්ගලයාගේ මානසික ක්‍රියාවලිය. |

ඉහත 'අ' තීරුවේ දැක්වෙන සමාජීය විද්‍යා උප විෂය හා සම්බන්ධ අධ්‍යයනයන් 'ආ' සමග අනුපිළිවෙළින් නිවැරදිව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A , B , C හා D ය.
(2) C , D , A හා B ය.
(3) B , C , D හා A ය.
(4) A , C , B හා D ය.

* ප්‍රශ්න අංක 10-11 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් සමාජ පරිණාමීය අවධි උපයෝගී කර ගන්න.

**(A) ප්‍රාග් කොමියුනිස්ට් අවධිය.**
**(B) දේවවාදී අවධිය.**
**(C) සමාජවාදී අවධිය.**
**(D) යථානුභූත අවධිය.**
**(E) සුපිරි කොමියුනිස්ට් අවධිය.**

(10) සමාජ පරිණාමී අවධි අනුව සමාජ විෂමතාව දක්නට නොවූ අවධිය ඇතුළත් වරණය තෝරන්න.

(1) A , B හා C ය.
(2) B , C හා D ය.
(3) C , D හා E ය.
(4) A , C හා E ය.

(11) අධි ස්වභාවික බලවේගයන් මත සියලු නිර්මාණයන් රඳවා බිය මුසු ගෞරවයකින් යුක්තව ක්‍රියා කළ සමාජ අවධිය නම්,

(1) A ය.
(2) B ය.
(3) C ය.
(4) D ය.

www.pirivena.lk

[3 වැනි පිටුව බලන්න.

* ප්‍රශ්න අංක 12-14 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් විසින් රචිත කෘතීන් උපයෝගි කරගන්න.

**(A) සමාජයේ ශ්‍රම විභජනය.** **(B) යථානුභූත දර්ශනය.**

**(C) ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම හා ධනවාදයේ හරය.** **(D) මානව සමාජය.**

**(E) ආත්ම ඝාතනය.**

(12) යාන්ත්‍රික ඒකාබද්ධතාව, ඓන්ද්‍රීය ඒකාබද්ධතාව ලෙස සමාජ වර්ග කිරීම පිළිබඳව විස්තර අන්තර්ගත කෘතිය කුමක්ද?

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(13) ප්‍රංශ ජාතික සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් විසින් රචිත කෘතීන් ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.

(1) A , B හා C ය. (2) B , C හා D ය. (3) C , D හා E ය. (4) A , B හා E ය.

(14) බටහිර සමාජ ධනවාදි ආර්ථික සංවර්ධනයක් කෙරෙහි යොමුවීම සඳහා තොරතුරු අන්තර්ගත කෘතිය නම්,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

* ප්‍රශ්න අංක 15-16 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන කරුණු උපයෝගි කරගන්න.

**(A) සාමූහිකව ජීවත් වූ පිරිසක් සිටීම.** **(B) පුද්ගල හැකියාවන්ට ප්‍රමුඛතාව ලැබීම.**

**(C) සමාජ හා සත්ත්ව ලෝකය විමර්ශනශීලි නොවීම.** **(D) සමාජ ස්ථරායනයක් දක්නට ලැබීම.**

**(E) එක් පුද්ගලයෙකුගේ පාලනයට සමාජය නතුවීම.** **(F) සමාජ සම්බන්ධතා නෛතික ස්වරූපයක් ගැනීම.**

(15) සමාජ විද්‍යාඥයින්ගේ සමාජ වර්ග කිරීමට අනුව පැරණි සමාජය තුළ දක්නට නොවූ ලක්ෂණ ඇතුළත් වරණය තෝරන්න.

(1) A , B හා C ය. (2) C , D හා E ය. (3) D , E හා F ය. (4) B , D හා F ය.

(16) සාධිත තත්ත්ව සංකල්පයට අර්ථ විවරණයක් සරලව සපයා ඇත් වරණය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(17) කාල් මාක්ස්ගේ සමාජ පරිණාමීය අගය කිරීම තුළ ප්‍රථමයෙන්ම සමාජය තුළ පන්ති භේදය ආරම්භ වූ යුගය කුමක්ද?

(1) ප්‍රාග් කොමියුනිස්ට් යුගය. (2) සමාජවාදී යුගය.

(3) සුපිරි කොමියුනිස්ට් යුගය. (4) වහල් යුගය.

(18) ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික ප්‍රතිසංස්කරණ සමාජගත කිරීම උදෙසා මූලිකව ක්‍රියා කළේ,

(1) මාටින් ලූතර් කිං ය. (2) ජෝන් කැල්වින් ය.

(3) මාටින් ලූතර් ය. (4) රැල්ෆ් ලින්ටන් ය.

(19) "මහරජ ඔබ මේ රටේ භාරකරුවා මිස අයිතිකරු නොවේ." මෙම සංකල්පය ජනගත කළේ,

(1) දේවානම්පියතිස්ස රජු ය. (2) බුදුන් වහන්සේ ය. (3) මිහිඳු මහ රහතන් වහන්සේ ය. (4) සිරිසඟබෝ රජු ය.

(20) වැවයි - දාගැබයි , ගමයි - පන්සලයි යන සංකල්පය මෙරට සමාජය තුළ පිබිදීමක් ඇති කළේ,

(1) කෘෂි කර්මාන්තයෙන් මෙරට සමෘද්ධ වීම නිසයි.

(2) රජ දරුවන් කෘෂි කර්මාන්තය නගා සිටුවීමයි.

(3) රජදරුවන් වැව් හා දාගැබ් නිර්මාණය කළ නිසයි.

(4) බුදු දහමින් ලැබුණු ආභාසය නිසයි.

www.pirivena.lk

[4 වැනි පිටුව බලන්න.

(21) රාජ්‍ය පාලකයා නිරතුරුවම ජනතාවගේ ආර්ථික සමෘද්ධිය උදෙසා ක්‍රියා කළ යුතු බව පෙන්වා දෙන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?

(1) කූටදන්ත සූත්‍රය. (2) අග්ගඤ්ඤ සූත්‍රය.
(3) ව්‍යග්ගපජ්ජ සූත්‍රය. (4) ඉන්ද්‍රක සූත්‍රය.

(22) සංස්කෘතිය නම් සංකල්පය තුළ අන්තර්ගත ප්‍රධාන ක්ෂේත්‍ර දෙක නිවරදිව දැක්වෙන වරණය තෝරන්න.

(1) මහා සංස්කෘතිය හා උප සංස්කෘතිය.
(2) භෞතික සංස්කෘතිය හා විධිමත් සංස්කෘතිය.
(3) අවිධිමත් සංස්කෘතිය හා විධිමත් සංස්කෘතිය.
(4) බටහිර සංස්කෘතිය හා ආසියාතික සංස්කෘතිය.

* ප්‍රශ්න අංක 23 -25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික ලක්ෂණ උපයෝගි කරගන්න.

**(A) කුල භේදය බැහැර කිරීම.** **(B) ප්‍රාණඝාතය බැහැර කිරීම.**
**(C) ගව මස් ආහාරයට නොගැනීම.** **(D) කිරිකොරහ ශාන්තිකර්මය සිදු කිරීම.**
**(E) එක් දෙවියෙකු පිළිබඳ විශ්වාස කිරීම.**

(23) බෞද්ධ, ක්‍රිස්තියානි, ඉස්ලාම් යන සංස්කෘතික ඉගැන්වීම්වල දක්නට ලැබෙන පොදු ලක්ෂණය ඇතුළත් වරණය කුමක්ද?

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) A හා C ය.

(24) හිංදු ආගමික සංස්කෘතික ඉගැන්වීම් ඇතුළත් වරණය තෝරන්න.

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා E ය. (4) A හා C ය.

(25) මෙරට මුල් පදිංචිකරුවන් වන ආදිවාසීන්ගේ සංස්කෘතිය හා බැඳී පවතින ප්‍රබල ලක්ෂණයක් දක්නට ලැබෙන පිළිතුර වන්නේ,

(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

(26) බලවත් සංස්කෘතියක බලපෑම හේතුවෙන් දුර්වල සංස්කෘතික උරුමයන් වේගයෙන් වෙනස් වන අතර ඇතැම් ලක්ෂණ එලෙසම පවතී නම් එය,

(1) සංස්කෘතික ගැටුමයි. (2) සංස්කෘතික විසරණයයි.
(3) සංස්කෘතික ප්‍රභවයයි. (4) සංස්කෘතික ලැග්මයි.

(27) මෙරටට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ තුළ ප්‍රබල බලපෑමක් සිදු වූයේ වැව් අමුණු ඇතුළු වාරිමාර්ග පද්ධතියට බව අවධාරණය කළේ,

(1) මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන ය. (2) මහාචාර්ය සෙනරත් පරණවිතාන ය.
(3) මහාචාර්ය නන්දසේන රත්නපාල ය. (4) ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර ය.

(28) වර්තමානය වන විට ලාංකීය සමාජයේ මව, පියා හා ඔවුන්ගේ දරුවන් පමණක් එකම නිවසක් තුළ ජීවත්ව වාසය කිරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. මෙම පවුල් ක්‍රමය සමාජ විද්‍යාව තුළ හඳුන්වන්නේ,

(1) විස්තෘත පවුල යි. (2) න්‍යෂ්ටික පවුල යි.
(3) පීතෘ වාසික පවුල යි. (4) මාතෘ වාසික පවුල යි.

www.pirivena.lk

[5 වැනි පිටුව බලන්න.

(29) බෞද්ධ ආගමික ස්ථාන මූලික කරගෙන සංවිධානය කෙරෙන පෙරහැර, තොරණ, වෙසක් සැරසිලි යන මෙම සංකල්පවල සමාජ විද්‍යාත්මක වටිනාකම අන්තර්ගත වරණය කුමක්ද?

(1) පොදු ජනයා සඳහා විනෝදය ලැබීමට අවස්ථාව ලබාදීමයි.
(2) මානව සමාජයේ අන්තර් සබඳතා ප්‍රදර්ශනය වීමයි.
(3) බෞද්ධ සිරිත් - විරිත් ප්‍රදර්ශනය කිරීමයි.
(4) පුද්ගලයා සතු සහජ දක්ෂතා ප්‍රදර්ශනය කිරීමයි.

(30) පුද්ගල පෞරුෂ වර්ධනය කෙරෙහි පාරිසරික සහ සංස්කෘතික සාධක වල බලපෑම පිළිබඳව කෙරෙන කරුණු දැක්වීම සිදුකරන බෞද්ධ ජාතක කතාව කුමක්ද?

(1) ඉල්ලීස ජාතකය යි. (2) සත්තිගුම්භ ජාතකය යි.
(3) මහා සුපින ජාතකය යි. (4) වෙස්සන්තර ජාතකය යි.

(31) වර්තමාන සමාජ තුළ ඇගයීමට බඳුන් වන්නේ ආරෝපිත තත්ත්වයන් වලට වඩා සාධිත තත්ත්වයයි. මෙම සංකල්පය පිළිබඳව විවරණය සපයන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?

(1) කරණීය මෙත්ත සූතුර යි. (2) මංගල සූතුර යි.
(3) වසල සූතුර යි. (4) පරාභව සූතුර යි.

(32) සමාජ විද්‍යාවේ වැදගත් සංකල්පයක් වන සමාජානුයෝජන සංකල්පය පිළිබඳව ඉතා ගැඹුරින් විමර්ශනය කරන බෞද්ධ සූත්‍ර දේශනාව නම්,

(1) චක්කවත්තිසීහනාද සූත්‍රය යි. (2) ව්‍යග්ගපජ්ජ සූත්‍රය යි. (3) ඉන්දක සූත්‍රය යි. (4) කූටදන්ත සූත්‍රය යි.

(33) තමාට අයත් නොවන සියල්ල අන්සතුය. ඒවා නොදන්වා ගැනීම සොරකමකි. සොරකම් කිරීම අපාගත වීමට හේතුවන බව ප්‍රකාශිත බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?

(1) චූල්ලහත්ථිපදෝපම සූත්‍රය යි. (2) මහා මංගල සූත්‍රය යි.
(3) ව්‍යග්ගපජ්ජ සූත්‍රය යි (4) ධනඤ්ජානි සූත්‍රය යි.

(34) ශ්‍රී ලංකාවේ අතීත ජන සමාජයේ පාලන ව්‍යුහය පිළිබඳව තොරතුරු ගවේශණය කළ හැකි දේශීය මූලාශ්‍රය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(1) වංසත්ථප්පකාසිනිය, දීපවංශය. (2) රාජ රත්නාකරය, මහාවංශය.
(3) ධර්ම ප්‍රදීපිකාව, මහාවංශය. (4) මහාවංශය, දීපවංශය.

* ප්‍රශ්න අංක 35 -36 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන කරුණු උපයෝගි කරගන්න.

**A. (i) සමාජ අපගාමීත්වය.**
**(ii) සමාජ සංවරතාව.**

**B. (i) යුක්තිය හා සාධාරණත්වය.**
**(ii) සමාජ ප්‍රශ්න.**

**C. (i) සමාජ සාරධර්ම.**
**(ii) ස්වයං ශික්ෂණය.**

**D. (i) රාජ්‍ය පාලකයාගේ බලය.**
**(ii) මානව නිදහස.**

www.pirivena.lk

(35) අංක **(i)** හි වැඩිවීම අංක **(ii)** හි අඩුවීම කෙරෙහි බලපෑම් කරන යුගල දෙක තෝරන්න.

(1) A හා B ය. (2) A හා C ය.
(3) B හා C ය. (4) B හා D ය.

(36) අංක **(i)** හි අඩුවීම අංක **(ii)** හි වැඩිවීම කෙරෙහි බලපෑම් කරන යුගල දෙක තෝරන්න.

(1) A හා B ය. (2) A හා C ය.
(3) B හා C ය. (4) C හා D ය.

(37) සමාජයක් පාලනය කිරීමේදී එය විධිමත්ව සිදුකර ගැනීම සඳහා යොදාගන්නා ක්‍රමවත් සමාජ පාලන ආයතනය නම්.

(1) සිරිත් - විරිත් ය. (2) සාරධර්ම ය.
(3) අධිකරණය ය. (4) දූෂමාන ආරංචි ය.

(38) සමාජ ප්‍රශ්න ඇතිවීම කෙරෙහි පුද්ගල මනෝභාවයන් තුළ පවතින 'විචිකිච්ඡාව' ප්‍රබල සාධකයකි. විචිකිච්ඡාව යනු,

(1) සිතෙහි ඇතිවන තුරුස්සන බවයි.
(2) සිතෙහි ඇතිවන නොසන්සුන් බවයි.
(3) සිතෙහි ඇතිවන අලස බවයි.
(4) සිතෙහි ඇතිවන සැක සහිත බවයි.

(39) පුද්ගලයෙකු කිසියම් ක්‍රියාවක නිරතවීමට පෙර එය තමාට, සමාජයට හා ධර්මයට අනුචිත දැයි පරීක්ෂා කිරීමට අනුබල දෙන සූත්‍ර දේශනාව කුමක්ද?

(1) කාලාම සූත්‍රය යි. (2) ආධිපත්‍යය සූත්‍රය යි.
(3) සිඟාලෝවාද සූත්‍රය යි. (4) ව්‍යග්ගපජ්ජ සූත්‍රය යි.

(40) බෞද්ධ විහාරස්ථානවල නිමවා ඇති අපාය සංකල්පය තුළින් අපේක්ෂිත සමාජ අරමුණ නිවැරදිව දැක්වෙන වරණය කුමක්ද?

(1) අකුසල් කිරීම අපාගත වීමට හේතු වන බවයි.
(2) සමාජ පාලනය සඳහා පිටිවහල් කරගත් බවයි.
(3) කරන ලද අකුසල් අපාගත වීමෙන් අවසන් වන බවයි.
(4) විහාරස්ථාන වල අපාය සංකල්පය සිතුවම් කිරීම සම්ප්‍රදායක් බවයි.

* * *

www.pirivena.lk

# 2565 - මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2022

| 08 | S | I, II |
|---|---|---|

## (8) සමාජ විද්‍යාව - I, II

## සමාජ විද්‍යාව - II පත්‍රය

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්ද** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(1)

(i) මැක්ස් වෙබර් විසින් සමාජ විද්‍යා විෂය ධාරාවට හඳුන්වා දුන් සංකල්ප **දෙකක් ලියන්න.**

(ii) යමක් විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමේදී එහි පදනම කෙසේ විය යුතුද යන්න පැහැදිළි කෙරෙන බෞද්ධ සූත්‍ර **දෙකක් නම් කරන්න.**

(iii) සරල තත්ත්වයක සිට සංකීර්ණ තත්ත්වයකට සමාජය පරිණාමය වීම සඳහා එමිල් ඩූර්කයිම් ඉදිරිපත් කළ සාධක **දෙක නම් කරන්න.**

(iv) සම්භාව්‍ය සමාජ විද්‍යාඥයෙකු වූ හර්බට් ස්පෙන්සර්ට අනුව 'රණකාමී' සමාජය තුළ දක්නට ලැබුණු ලක්ෂණ **දෙකක් ලියන්න.**

(v) කාර්මීකරණය වන සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක් ලියන්න.**

(vi) සංස්කෘතික ගැටුම හේතුවෙන් සමාජය තුළ උද්ගතවන නවමු ලක්ෂණ **දෙකක් නම් කරන්න.**

(vii) සාධාරණත්වය හා යුක්තිය උදෙසා සමාජය පුහුණු කළ යුතු බව විවරණය කරන බෞද්ධ ප්‍රවේශයන් **දෙක නම් කරන්න.**

(viii) සමාජ ව්‍යූහයක දක්නට ලැබෙන ආයතන **දෙකක් සඳහන් කරන්න.**

(ix) වරදකරුවෙකු බන්ධනාගාරගත කිරීමෙන් අපේක්ෂා කරන ප්‍රධාන අරමුණු **දෙකක් ලියන්න.**

(x) වරදකරුවෙකුට නිදහස ලැබීම සඳහා හිමිවන ප්‍රධාන අවස්ථා **දෙකක් සඳහන් කරන්න.**

(ලකුණු 02 × 10 = 20)

(2)

(i) සමාජ පරිණාමය පිළිබඳව කාල් මාක්ස් ඉදිරිපත් කළ ප්‍රධාන න්‍යායයන් **දෙක නම් කරන්න.** (ලකුණු 02 යි)

(ii) දිළිඳු බව සඳහා බලපාන සාධක **තුනක් සඳහන් කරන්න.** (ලකුණු 03 යි)

(iii) බුදු දහමේ හා නූතන සමාජ විද්‍යාවේ පොදුවේ හඳුනාගත හැකි සමාජ විද්‍යාත්මක සංකල්ප **දෙකක් කෙටියෙන් විස්තර කරන්න.** (ලකුණු 05 යි)

(3)

(i) සමාජ පරිණාමය පිළිබඳව අදහස් දැක්වූ මුල්කාලීන සමාජ විද්‍යාඥයින් **දෙදෙනෙකු නම් කරන්න.** (ලකුණු 02 යි)

(ii) සමාජ පරිණාමය පිළිබඳව ඔගස්ට් කොම්ට් විසින් පෙන්වා දුන් ප්‍රධාන අංශ **තුන නම් කරන්න.** (ලකුණු 03 යි)

(iii) කාල් මාක්ස්ගේ සමාජ පරිණාම විග්‍රහයට අනුව පූර්ව කොමියුනිස්ට් හා සුපිරි කොමියුනිස්ට් යන යුගයන්හි ලක්ෂණ පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

(4)

(i) සමාජ වෙනස්වීම අධ්‍යයනය කළ හැකි ප්‍රධාන අංශ **දෙක නම් කරන්න.** (ලකුණු 02 යි)

(ii) කෙටිකාලීන සමාජ වෙනස්වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක **තුනක් නම් කරන්න.** (ලකුණු 03 යි)

(iii) සමාජය තුළ නව වෙනසක් ඇතිකිරීම සඳහා බලපෑම් කරන සාධක **දෙකක් පිළිබඳ විමසීමක් කරන්න.**

(ලකුණු 05 යි)

www.pirivena.lk

[8 වැනි පිටුව බලන්න.

(5)

(i) ශ්‍රී ලංකේය සමාජය තුළ දක්නට ලැබෙන උප සංස්කෘතීන් **දෙකක් නම් කරන්න.** (ලකුණු 02 යි)

(ii) පුද්ගලයා සමාජගත කිරීමේ ද්විතීයික ක්ෂේත්‍ර **තුනක් නම් කරන්න**. (ලකුණු 03 යි)

(iii) පෞරුෂ සංවර්ධනය සඳහා බාහිර පරිසර සාධක හේතුවන බව 'සත්තිගුම්භ' ජාතකය ඇසුරින් සාධක **දෙකක් ඔස්සේ විස්තර කරන්න**. (ලකුණු 05 යි)

(6)

(i) ආදිතම ලාංකේය මානවයා ලෞකික අපේක්ෂා ඉටුකර ගැනීම සඳහා විශ්වාසය තැබූ අධි ස්වභාවික බලවේග **දෙකක් නම් කරන්න.** (ලකුණු 02 යි)

(ii) බෞද්ධ භික්ෂූන් වහන්සේ සමාජය උදෙසා ඉටුකරන කාර්යයන් **තුනක් නම් කරන්න.** (ලකුණු 03 යි)

(iii) සමාජ සාධාරණත්වය හා යුක්තිය පසිඳලීම සඳහා පංචශීලයේ එන ඉගැන්වීම් **දෙකක් පිළිබඳව විමසීමක් කරන්න.** (ලකුණු 05 යි)

(7)

(i) සමාජ ගැටුම් අවම කිරීම උදෙසා යොදාගත හැකි අවිධිමත් සමාජ පාලන කාරකයන් **දෙකක් නම් කරන්න.** (ලකුණු 02 යි)

(ii) මැක්ස් වේබර් විසින් සමාජ විද්‍යාව විෂය ධාරාවට හඳුන්වා දුන් ත්‍රිවිධාකාර ආධිපත්‍ය සංකල්පය නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) වරදකරුවෙකු බන්ධනාගාරගත කිරීමෙන් පසු ඔවුන් සමාජගත කළ යුතු ආකාරය ක්ෂේත්‍ර **දෙකක් ඔස්සේ පැහැදිළි කරන්න. .** (ලකුණු 05 යි)

(8)

(i) සමාජ විද්‍යා පර්යේෂණයක අරමුණු මූලික වශයෙන් වර්ග කළ හැකි ප්‍රධාන කාණ්ඩ **දෙක නම් කරන්න**. (ලකුණු 02 යි)

(ii) සමාජ විද්‍යා පර්යේෂණයක දී දත්ත රැස්කිරීම සඳහා යොදා ගන්නා නිරීක්ෂණයේ ප්‍රධාන අංග **තුන නම් කරන්න.** (ලකුණු 03 යි)

(iii) සමාජ විද්‍යා පර්යේෂණයක අවශ්‍යතාව ක්ෂේත්‍ර **දෙකක් ඔස්සේ විස්තර කරන්න.** (ලකුණු 03 යි)

* * *

www.pirivena.lk

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## සමාජ විද්‍යාව 1,2
## (08) සමාජ විද්‍යාව 1
## සුදුසුකම් ලැබීමේ විභාගය

කාලය පැය 03යි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

- ❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.
- ❖ අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ❖ ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.

---

**01.** සමාජ විද්‍යාව පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ නියමුවන් අතර 'සමාජ විද්‍යාව යනු සමාජය පිළිබඳව ප්‍රධාන විද්‍යාවයි යනුවෙන් ඉදිරිපත් කරනු ලැබුයේ කිනම් විද්‍යාඥයා විසින් ද?

1. ඔගස්ට් කොම්ට් 2. කිංස්ලි ඬේවිඩ්ස්
3. එච්. පී. ෆෙයාවයිල්ඩ් 4. ඒ. ඩබ්ලිව්. සමෙල් ය.

**02.** යථානුභූත දර්ශනය නම් කෘතියේ කර්තෘවරයා වන්නේ කවුද?

1. කාල් මාක්ස් 2. එමිල් ඩුර්ක්හයිම්
3. ඔගස්ට් කොම්ට් 4. මැක්ස් වේබර් ය.

**03.** එමිල් ඩුර්ක්හයිම් කිනම් ජාතිකයෙක් වන්නේ ද?

1. ඉතාලි ජාතිකයෙකි. 2. ඇමෙරිකානු ජාතිකයෙකි.
3. ප්‍රංශ ජාතිකයෙකි. 3. ඕස්ට්‍රේලියානු ජාතිකයෙකි.

**04.** ආගමික ජීවිතයේ හරය නමැති කෘතියේ රචකයා වන්නේ කවුද?

1. එමිල් ඩුර්ක්හයිම් ය. 2. මැක්ස් වේබර් ය.
3. කාල් මාක්ස් ය. 4. හර්බට් ස්පෙන්සර් ය.

**05.** නිලබල ක්‍රමය හඳුන්වා දුන්නේ කිනම් සමාජ විද්‍යාඥයා විසින් ද?

1. මැක්ස් වේබර් විසිනි. 2. එමිල් ඩුර්ක්හයිම් විසිනි.
3. කාල් මාක්ස් විසිනි. 4. හර්බට් ස්පෙන්සර් විසිනි.

**06.** බෞද්ධ සමාජ විද්‍යාව කෘතියේ රචකයා වන්නේ කවුද?

1. බද්දේගම විමලවංස හිමියන් ය. 2. නන්දසේන රත්නපාල මහතා ය.
3. ප්‍රණීත් අභයසුන්දර මහතා ය. 4. වල්පොල රාහුල හිමියන් ය.

www.pirivena.lk

**07.** බුදුදහම සමාජ හා දේශපාලන විරෝධි ආත්මාර්ථය පදනම් කරගත් ආගමක් යැයි සඳහන් කරමින් අදහස් දැක්වූයේ කිනම් සමාජ විද්‍යාඥයා ද?

1. කාල් මාක්ස් ය.
2. මැක්ස් වේබර් ය.
3. ඔගස්ට් කොම්ට් ය.
4. හර්බට් ස්පෙන්සර් ය.

**08.** සමාජ පරිණාමය පිළිබඳ කරුණු සවිස්තරව ඇතුළත් ව ඇති බෞද්ධ සූත්‍ර දේශනාවක් වන්නේ,

1. අග්ගඤ්ඤ සූත්‍රය
2. කාලාම සූත්‍රය
3. ධම්මික සූත්‍රය
4. කූටදන්ත සූත්‍රය

**09.** අනාගතයේ සමාජය වෙනස්වන ආකාරය බුදුන් වහන්සේ දක්වා වදාළ ජාතක දේශනාවක් වන්නේ,

1.නළපාන ජාතකය යි.
2. මහා ධර්මපාල ජාතකය යි.
3. මහා සුපින ජාතකය යි.
4. වෙස්සන්තර ජාතකය යි.

**10.** කෙටි කාලීන සමාජ වෙනස් වීම කෙරෙහි බල නොපාන සාධකයක් ඇතුළත් වර්ණය වන්නේ,

1. දේශපාලන ව්‍යාපාර
2. සංස්කෘතික සහයෝගිතා ව්‍යාපාර
3. මෝස්තර ව්‍යාපාරය
4. බටහිරකරණය

**11.** සමාජය තැනිය යුත්තේ දෙවියන් විසින් නොව මිනිසා විසිනි. මෙම අදහස ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයා වන්නේ කවුද?

1. ඔගස්ට් කොම්ට් ය.
2. කාල් මාක්ස් ය.
3. මැක්ස් වේබර් ය.
4. රේමන්ඩ් පර්ත් ය.

**12.** ප්‍රාථමික සමාජයේ ජීවත් වූවන් විසින් සියලු දෑ දෙවියන්ගේ නිර්මාණ බව සද්භාවයෙන් යුතුව අදහනු ලැබුවේ ය. මෙකී සමාජය ඔගස්ට් කොම්ට් නම් සමාජ චින්තකයා නම් කළේ,

1. දේවවාදී අවදිය ලෙස ය.
2. පාර භෞතික අවදිය ලෙස ය.
3. යථානුභූත අවදිය ලෙස ය.
4. ඉහත කිසිදු පිළිතුරක් නොවේ.

**13.** කාල් මාක්ස් ඉදිරිපත් කළ සමාජ පරිණාමීය යුග අතරට ඇතුළත් නොකළ හැකි පිළිතුර ඇතුළත් වර්ණය වන්නේ,

1. ප්‍රාථමික කොමියුනිස්ට් අවධිය
2. වැඩවසම් යුගය
3. යථානුභූත අවධිය
4. සමාජවාදී අවධිය

**14.** නාගරීකරණය නිසා සිදු වූ යහපත් ප්‍රතිඵලයක් නොවන්නේ මෙයින් කුමක්ද?

1. විධිමත් පාලන සංවිධාන බිහි වීම
2. පොදු පහසුකම් වැඩිදියුණු වීම
3. සමාජ අගනාකම් සාරධර්ම පරිහානියට පත්වීම
4. අලුත් සමාජ සම්බන්ධතා ජාලයක් නිර්මාණය වීම

**15.** ප්‍රංශ විප්ලවය ඇති වූ වර්ෂය නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. ක්‍රි.ව. 1879 දී ය.
2. 1789 දී ය.
3. 1978 දී ය.
4. 1798 දී ය.

**16.** මනා ආර්ථික කලමණාකරණයක් සඳහා වටිනා උපදේශයක් ඇතුළත් 'එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය ගාථාව ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ,

1. මහාමංගල සූත්‍රය යි. 2. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.

3. පත්තකම්ම සූත්‍රය යි. 4. සිගාලෝවාද සූත්‍රය යි.

**17.** සතර සංග්‍රහවස්තු අතරට ගිණිය නොහැකි පිළිතුර ඇතුළත් වර්ණය වන්නේ,

1. දානය 2. සීලය 3. සමානාත්මතාව 4. ප්‍රියවචනය

**18.** එදා හෙළදිව නමැති කෘතියේ රචකයා කවුද?

1. රොබට් බවුන්රිග් 2. රොබට් නොක්ස්

3. විල්බට් මුවර් 4. සිග්මන් ෆ්‍රොයිඩ්

**19.** සංස්කෘතික ලැග්ම නමැති සංකල්පය මුල්වරට හඳුන්වා දී ඇති සමාජ විද්‍යාඥයා වන්නේ,

1.ඩබ්.එෆ්. ඔග්බර්න් 2. රූත් බෙනඩික්ට්

3. ප්‍රාන්ස් බොආස් 4. තොන්ස්ටන් සෙලින්

**20.** නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති මෙරටට හඳුන්වා දුන්නේ කවුද?

1. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා 2. අනගාරික ධර්මපාලතුමා

3. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර තුමා 4. රීස් ඩේවිඩ්ස් තුමා

21. අතීතයේ ගම පාලනය කළ තැනැත්තා හැඳින්වූ නාමය වන්නේ,

1. මහා සම්මත 2. ගාමණී

3. රජ 4. සේනාපති

**22.** ශ්‍රී ලංකාවේ අයබදු ඒකරාශි කළ ආකාරයත් ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳත් දැක්වෙන ශිලාලේඛනයක් වන්නේ,

1. වල්ලිපුරම් රන් සන්නස 2. කිරින්ද සෙල්ලිපිය

3. බදුලු සෙල්ලිපිය 4. මිහින්තලා සෙල්ලිපිය

**23.** දිසා අධිකරණයක් මගින් විභාග නොකරන නඩුවක් වන්නේ මෙයින් කුමක්ද?

1. දික්කසාද නඩු

2. ස්ත්‍රී දූෂණ සම්බන්ධ නඩු

3. විවාහ පොරොන්දු කඩකිරීම් සම්බන්ධ නඩු

4. පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩවීමක් සම්බන්ධ නඩු

**24.** පංච නීවරණ අතරට ඇතුළු නොවන කරුණක් වන්නේ,

1. ථිනමිද්ධය 2. කාමච්ඡන්දය

3. අවිරෝධතාව 4. විචිකිච්ඡා

www.pirivena.lk

- 25, 26 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු උපයෝගී කරගන්න.

  A - පෞද්ගලික අරමුණුවලට මුල්තැනක් දීම

  B - අපි යන හැඟීමෙන් කටයුතු කිරීම

  C - ආරෝපිත තත්ත්වයක් විද්‍යමාන වීම

  D - නෛතික සමාජ පාලනයක් ඇති බව

  E - සාධිත තත්ත්වයෙන් යුතු වීම

  F - සමාජ සම්බන්ධතා මාර්ගයෙන් සමාජය පාලනය වීම

**25.** ඓන්ද්‍රිය ඒකාබද්ධතාවෙන් යුක්ත සමාජයක ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ,

1. A,D,E  2. A,E,F  3. B,D,f  4. A,C,E

**26.** යාන්ත්‍රික ඒකාබද්ධතාවෙන් යුක්ත සමාජයක ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ,

1. A,D,E  2. B,C,F  3. B,D,f  4. A,C,E

- පහතින් දක්වා ඇති තොරතුරු හොඳින් පිරික්සා බලා නිවැරදි පිළිතුර තෝරන්න.

  ❖ ගොඩනංවාගත් අරමුණු ඉටුකර ගැනීම විෂයයෙහි ක්‍රියාත්මක වීම.

  ❖ මනා සංවිධානාත්මක බව

  ❖ සමාජ අසාධාරණයට එරෙහිව ක්‍රියාත්මක වීම

  ❖ සමාජයට මග පෙන්වමින් පාලක පක්ෂයට බලපෑම් කිරීම

**27.** ඉහතින් වූ ලක්ෂණ අතුරින් කෙටිකාලීන සමාජ වෙනස් කිරීමේ ව්‍යාපාරය වන්නේ,

1. දේශපාලන විරෝධතා ව්‍යාපාරය යි
2. සංස්කෘතික සහයෝගිතා ව්‍යාපාරය යි
3. මෝස්තර ව්‍යාපාරය යි
4. ප්‍රචාරණ ව්‍යාපාරය යි

- දුප්පත් රටක් සංවර්ධනය දක්වා ගෙන යාමේ දී සොරකම, දූෂණය වැනි අපරාධ නැති කිරීම කළ යුතුය. ඒ සඳහා පාලකයා විසින්,

  වෙළඳාම් කිරීමට කැමති අයට මූල්‍ය පහසුකම් දීම

  ගොවිතැන් කිරීමට අපේක්ෂා කරන අයට ඒ සඳහා අවැසි ජල පහසුකම් හා ඉඩම් ලබාදීම

  ආදිය මුල් තැනක් ගනී.

**28.** ඉහත කරුණු අන්තර්ගත වන බෞද්ධ සූත්‍ර ධර්මය වන්නේ,

1. මහාමංගල සූත්‍රය යි
2. සිගාලෝවාද සූත්‍රය යි
3. කූටදන්ත සූත්‍රය යි
4. අරියපරියේසන සූත්‍රය යි

**29.** සංස්කෘතික ගැටුම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

1. පරම්පරා අතර ගැටුමයි
2. ආගම් අතර ගැටුමයි
3. සංස්කෘති දෙකක් හෝ කිහිපයක් අතර ගැටුමයි
4. ජාතීන් දෙකක් අතර බලය පිළිබඳ ගැටුමයි

www.pirivena.lk

**30.** ශ්‍රී ලංකාවේ ජීවත් වන ජනවර්ග අනුව වැඩි වශයෙන්ම ජීවත් වන ජනවර්ග ඇතුළත් නිවැරදි වර්ණය වන්නේ,

1. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් 2. සිංහල, දෙමළ. ජපන්, මැලේ
3. දෙමළ, මැලේ, ජා, මුස්ලිම් 4. සිංහල, දෙමළ, බර්ගර්, මැලේ

**31.** ධර්මයේ සඳහන් අන්දමට සමාජ පාලනයට වැදගත් වන දේවධර්මය හෙවත් හිරි ඔත්තප්ප මගින් අදහස් වන කරුණ වන්නේ,

1. ලැජ්ජාව හා බයයි
2. කුසලයට ඇති ලැජ්ජාව හා බයයි
3. සමාජයට මුහුණ දීමේ ලැජ්ජාව හා බයයි
4. පවට ඇති ලැජ්ජාව හා පවේ විපාකයට ඇති බයයි

**32.** වයස අවුරුදු 16-21 දක්වා වූ තරුණ වරදකරුවන් පුනරුත්ථාපනය සඳහා පිහිටුවා ඇති ආයතනය වන්නේ මෙයින් කුමක්ද?

1. බන්ධනාගාරය යි
2. රක්ෂිත බන්ධනාගාරය යි
3. තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයයි
4. තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයයි.

**33.** තමන්ගේ සිතේ ඇතිවන ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය වැනි අසද්ධර්ම සංකල්ප දුරු කරගෙන සිත මනා පාලනයක් දක්වා වර්ධනය කර ගැනීමට හැකිවන භාවනා ක්‍රමයක් වන්නේ,

1. බුද්ධානුස්සති භාවනාවයි 2. මෙත්තානුස්සති භාවනාවයි
3. අසුභානුස්සති භාවනාවයි 4. මරණානුස්සති භාවනාවයි

**34.** සමාජ පැවැත්ම සඳහා අතිශයින් හේතුවන යුතුකම් හා වගකීම් පිළිබඳ දැක්වෙන බෞද්ධ සූත්‍රය වන්නේ,

1. කාලාම සූත්‍රයයි 2. සිගාලෝවාද සූත්‍රයයි
3. චූල්ල හත්ථි පදෝපම සූත්‍රයයි 4. අග්ගඤ්ඤ සූත්‍රයයි

**35.** සමාජීය විද්‍යා විෂයයන් පමණක් අන්තර්ගත වර්ණය මෙයින් කුමක්ද?

1. සමාජ විද්‍යාව, ජීව විද්‍යාව, දේශපාලන විද්‍යාව
2. පරිසර විද්‍යාව, මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව
3. මනෝවිද්‍යාව, මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව
4. දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව

**36.** සමාජය විද්‍යාත්මකව තේරුම් ගැනීම සඳහා සමාජ ස්ථිතිකත්වය හා සමාජ ගතිකත්වය හැදෑරිය යුතු බවට පෙන්වා දුන් සමාජ දාර්ශනිකයා වන්නේ,

1. කාල් මාක්ස් 2. ඔගස්ට් කොම්ට් ය
3. එමිල් ඩුර්ක්හයිම් ය 4. මැක්ස් වෙබර් ය

**37.** සමාජ පරිණාමය අවබෝධ කරගැනීමට නම් පන්ති ගැටුම්වල ඉතිහාසය හැදෑරිය යුතුය. මෙය කාගේ අදහසක් ද?

1. කාල් මාක්ස් 2. ඔගස්ට් කොම්ට් ය
3. එමිල් ඩුර්ක්හයිම් ය 4. මැක්ස් වෙබර් ය

www.pirivena.lk

**38.** සමාජ ක්‍රියා න්‍යාය පෙන්වා දුන් සමාජ දාර්ශනිකයා කවුද?

1. කාල් මාක්ස්　　　　2. ඔගස්ට් කොම්ට් ය

3. එමිල් ඩුර්ක්හයිම් ය　　　　4. මැක්ස් වෙබර් ය

**39.** පළමු වතාවට සමාජ විද්‍යාවට පර්යේෂණ ක්‍රමයක් හඳුන්වා දුන්නේ කවුද?

1. කාල් මාක්ස්　　　　2. ඔගස්ට් කොම්ට් ය

3. එමිල් ඩුර්ක්හයිම් ය　　　　4. මැක්ස් වෙබර් ය

**40.** සියල්ල එකවර පිළිනොගෙන විමසුම් සහගතව බලා සත්‍ය අවබෝධ කරගන්නා බව දැක්වෙන සූත්‍ර දේශනාව වන්නේ,

1. මහා මංගල සූත්‍රය　　　　2. අග්ගඤ්ඤ සූත්‍රය

3. චක්කවත්ති සීහනාද සූත්‍රය　　　　4. කාලාම සූත්‍රය

❖ නිවැරදි පිළිතුර සොයා කතිරයකින් සලකුණු කරන්න.

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1** | 1 | 2 | 3 | 4 | **11** | 1 | 2 | 3 | 4 | **21** | 1 | 2 | 3 | 4 | **31** | 1 | 2 | 3 | 4 |
| **2** | 1 | 2 | 3 | 4 | **12** | 1 | 2 | 3 | 4 | **22** | 1 | 2 | 3 | 4 | **32** | 1 | 2 | 3 | 4 |
| **3** | 1 | 2 | 3 | 4 | **13** | 1 | 2 | 3 | 4 | **23** | 1 | 2 | 3 | 4 | **33** | 1 | 2 | 3 | 4 |
| **4** | 1 | 2 | 3 | 4 | **14** | 1 | 2 | 3 | 4 | **24** | 1 | 2 | 3 | 4 | **34** | 1 | 2 | 3 | 4 |
| **5** | 1 | 2 | 3 | 4 | **15** | 1 | 2 | 3 | 4 | **25** | 1 | 2 | 3 | 4 | **35** | 1 | 2 | 3 | 4 |
| **6** | 1 | 2 | 3 | 4 | **16** | 1 | 2 | 3 | 4 | **26** | 1 | 2 | 3 | 4 | **36** | 1 | 2 | 3 | 4 |
| **7** | 1 | 2 | 3 | 4 | **17** | 1 | 2 | 3 | 4 | **27** | 1 | 2 | 3 | 4 | **37** | 1 | 2 | 3 | 4 |
| **8** | 1 | 2 | 3 | 4 | **18** | 1 | 2 | 3 | 4 | **28** | 1 | 2 | 3 | 4 | **38** | 1 | 2 | 3 | 4 |
| **9** | 1 | 2 | 3 | 4 | **19** | 1 | 2 | 3 | 4 | **29** | 1 | 2 | 3 | 4 | **39** | 1 | 2 | 3 | 4 |
| **10** | 1 | 2 | 3 | 4 | **20** | 1 | 2 | 3 | 4 | **30** | 1 | 2 | 3 | 4 | **40** | 1 | 2 | 3 | 4 |

පිළිතුරු සපයා ඇති ප්‍රශ්න ගණන　　:-

නිවැරදි පිළිතුරු ගණන　　:-

වැරදි පිළිතුරු ගණන　　:-

ලකුණු　　:-

www.pirivena.lk

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## සමාජ විද්‍යාව 1,2

## (08) සමාජ විද්‍යාව - 2වන පත්‍රය

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

❖ **පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**1.**

i. සමාජීය විද්‍යා විෂයයන් දෙකක් නම් කරන්න.

ii. මැක්ස් වේබර් පෙන්වා දී ඇති සමාජ පරිණාමීය අවදි 03 නම් කරන්න.

iii. සංස්කෘතියක් තවත් සංස්කෘතියකට වඩා උසස් හෝ පහත් නොවන බව කියැවෙන්නේ කුමන හේතුවක් නිසා ද?

iv. නීතියේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.

v. මෙරට අධිකරණ පද්ධතිය පිළිවෙළින් නම් කරන්න.

vi. වරදකරුවන් බන්ධනාගාර ගත කිරීමේ අරමුණු දෙකක් නම් කරන්න.

vii. ලෞකික දියුණුව සාක්ෂාත් කරගැනීම පිණිස උපදෙස් දෙන බෞද්ධ සූත්‍ර දේශනා 2ක් නම් කරන්න.

viii. ගෝලීයකරණය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

ix. සමාජ ප්‍රශ්න දෙකක් නම් කරන්න.

x. කාම මිථ්‍යාචාරය මගින් ඇති විය හැකි සමාජ ගැටලු දෙකක් නම් කරන්න.

(ලකුණු 02*10 = 20යි)

**2.**

i. සමාජ විද්‍යාව යනු කුමක්දැ'යි නිර්වචනයකින් පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

ii. සමාජ විද්‍යාව විෂයයක් වශයෙන් සංවර්ධනය වීම කෙරෙහි එමිල් ඩුර්ක්හයිම්ගෙන් සිදු වූ දායකත්වය කරුණු 03කින් පෙන්වා දෙන්න.

(ලකුණු 03යි)

iii. සමාජ විද්‍යාව විෂය හැදෑරීමෙන් ලද හැකි ප්‍රයෝජන 03ක් විස්තර කර දක්වන්න.

(ලකුණු 05යි)

**3.**

i. සමාජ වෙනස්වීම යනු කුමක්ද? වාක්‍යයකින් නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

ii. සමාජ වෙනස්වීම කෙරෙහි නාගරිකරණයෙන් සිදුවන බලපෑමට සාධක 03ක් ලියන්න.

(ලකුණු 03යි)

iii. 'සමාජ වෙනස්වීමත් සමග බෞද්ධ භික්ෂූන් වහන්සේගේ ද ඊට අනුගතව ඇත'. මෙම ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාව කරුණු 03කින් ඔප්පු කරන්න.

(ලකුණු 05යි)

www.pirivena.lk

**4.**

i. සංස්කෘතිය පිළිබඳ ඉදිරිපත් වී ඇති නිර්වචනයක් දක්වන්න. (ලකුණු 02යි)

ii. ඔබ ජීවත් වන සමාජයේ දැකිය හැකි උපසංස්කෘතීන් 03ක් නම් කරන්න. (ලකුණු 03යි)

iii. ශීඝ්‍රයෙන් ව්‍යාප්තවන බටහිරකරණය නිසා සිංහල සංස්කෘතිය වර්තමානය වන විට විවිධ වෙනස්කම්වලට ලක් ව ඇත. එසේ වෙනස්කම්වලට ලක් වී ඇති දෑ ලියා පැහැදිලි කරන්න. (අවම කරුණු දෙකක්වත් තිබිය යුතුය)

(ලකුණු 05යි)

**5.**

i. ශ්‍රී ලංකාවේ උත්සවාකාරයෙන් සමරන බෞද්ධ උත්සව දෙකක් නම් කරන්න.

(ලකුණු 02යි)

ii. බෞද්ධ රාජ්‍ය පාලනය උදෙසා ක්‍රියාත්මක කළ හැකි මූලධර්ම 03ක් නම් කරන්න.

(ලකුණු 03යි)

iii. 'ප්‍රාග් මහින්ද යුගයේ පැවති ආගමික ඇදහිලි මහින්දාගමනයෙන් පසු බෞද්ධ උරුවකට හැඩ ගැසී ඇත'. මේ කරුණ සාධක 03කින් පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

**6.**

i. සමාජ පාලනයේ ප්‍රධාන ප්‍රභේද 02 නම් කරන්න. (ලකුණු 02යි)

ii. පැරණි ලාංකේය සමාජයේ පාලනය සිදු වූ ආකාරය පිළිබඳ පැහැදිලි විස්තරයක් කරන්න.

(ලකුණු 03යි)

iii. නූතන සමාජ පාලනය සිදුවන්නේ කෙසේදැයි කරුණු 02ක් මගින් විස්තර කරන්න.

(ලකුණු 05යි)

**7.**

i. සමාජ ප්‍රශ්න 02ක් නම් කරන්න. (ලකුණු 02යි)

ii. සමාජ ප්‍රශ්න වර්ධනය කෙරෙහි බලපාන සාධක 03ක් නම් කරන්න. (ලකුණු 03යි)

iii. සමාජ ප්‍රශ්න අවම කරගැනීම කෙරෙහි බුදුදහමෙන් ලද හැකි ඉගැන්වීම් 03ක් පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

**8.**

i. ශ්‍රී ලංකාවේ ජීවත් වන ජාතීන් 04ක් නම් කරන්න. (ලකුණු 02යි)

ii. එයින් එක් ජාතියක් වාර්ෂිකව පවත්වන ආගමික උත්සව 03ක් නම් කරන්න. (ලකුණු 03යි)

iii. ජාතීන් අතර සාමය, සහයෝගය වර්ධනය කරගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 03ක් පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)


රාජකීය පණ්ඩිත පදියතලාවේ ඥාණවිමල හිමි

මො / ශ්‍රී විද්‍යානන්ද පිරිවෙණ,

යල්කුඹුර - බිබිල.

077 84 38 417

# අන්තර් විශ්වවිද්‍යාල භික්ෂු බලමණ්ඩලය සිප්යාය පිරිවෙන් අවසාන සම්මන්ත්‍රණ මාලාව - 2020

## 2564 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

### සමාජ විද්‍යාව

පැ. තුනයි

### II - පත්‍රය

I කොටසේ ප්‍රශ්න සියල්ලටත් II කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න

## I කොටස

01. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. සමාජ විද්‍යාව අධ්‍යයනය කරනු ලබන සංකල්ප දෙකක් ලියන්න.

ii. 'සමාජ විද්‍යාව යනු සමාජය පිළිබඳ ප්‍රධාන විද්‍යාවයි' යනුවෙන් අදහස් දැක් වූ සමාජ විද්‍යාඥයා හා එම අදහස ඇතුළත් කෘතිය නම් කරන්න.

iii. සමාජ ප්‍රශ්න බොහොමයක් ඇති වීමට හේතු වන ප්‍රබල සාධක දෙකක් ඉදිරිපත් කරන්න.

iv. සමාජ විද්‍යාව දර්ශනයෙන් මුදවා විද්‍යාත්මක විෂයක් ලෙස ව්‍යාප්ත කිරීමට කටයුතු කළ සමාජ විද්‍යාඥයා කවරෙක්ද?

v. නිළබල ක්‍රමයක ඇති ලක්ෂණ හතරක් නම් කරන්න.

vi. විද්‍යා විෂය බෙදා දැක්වෙන වර්ගීකරණ දක්වන්න.

vii. සමාජීය විද්‍යා / සමාජ ශාස්ත්‍ර දෙකක් නම් කරන්න.

viii. නෛතික පාලනයක තිබිය යුතු ලක්ෂණ අතුරෙන් 04ක් දක්වන්න.

ix. එමිල් ඩුර්කයිම් විසින් හඳුන්වා දුන් සමාජ ඒකාබද්ධතා ආකාර ගෙනහැර දක්වන්න.

x. සමාජ පරිණාමය පිළිබඳ අදහස් දැක් වූ කාල් මාක්ස් විසින් බෙදා දක්වන අවධි 06 නම් කරන්න.

(ලකුණු 2×10 = 20)

## II කොටස

මෙම කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

02. i. 'සමාජ විද්‍යාව' යන්නට නිර්වචන 03ක් දක්වන්න. (ලකුණු 02)

ii. සමාජ විද්‍යාව විෂයක් ලෙස සංවර්ධනය වූ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 03)

iii. බුදු දහම තුළ දක්නට ලැබෙන සමාජ විද්‍යාත්මක ලක්ෂණ විශ්ලේෂණය කරන්න. (ලකුණු 05)



www.pirivena.lk

03. i. සමාජය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. ස්වභාවික විද්‍යා විෂය අධ්‍යනය කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 03)

iii. සදාචාර සම්පන්න යහපත් සමාජ පැවැත්මක් උදෙසා ස්වාමි - භාර්යා යුතුකම් මගින් ලැබෙන පිටුබලය පෙන්වා දෙන්න. (ලකුණු 05)

04. i. සමාජ පරිණාමය යනු කුමක්ද? (ලකුණු 02)

ii. සමාජ පරිණාමයට හේතු වන කරුණු සාකච්ඡා කරන්න. (ලකුණු 03)

iii. පැරණි ග්‍රාමීය සමාජය නූතන නාගරික සමාජයකින් වෙනස් වන්නේ කෙසේදැයි නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. i. ඔබ දන්නා සමාජ ප්‍රශ්න 05ක් නම් කරන්න. (ලකුණු 02)

ii. ඉන් සමාජ ප්‍රශ්න 03කට විවරණ සපයන්න. (ලකුණු 03)

iii. ඔබ දැක් වූ සමාජ ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට ඔබ යෝජනා කරන කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

06. i. සමාජානුයෝජන ක්‍රියාවලියේ දී පිරිවෙනේ කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. තත්ත්වය හා කාර්යභාරය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 03)

iii. ස්වාමි සේවක සම්බන්ධය සමාජයේ යහ පැවැත්මට කෙසේ ඉවහල් වේ ද? විමසන්න. (ලකුණු 05)

07. i. සමාජ සංස්ථාවක මූලික ලක්‍ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. විවාහය යනු කුමක්දැයි යන්න සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කර ඇති නිර්වචන මගින් පහදන්න. (ලකුණු 03)

iii. සමූහයක් තුළ පවතින මූලික ලක්‍ෂණ විවරණය කරන්න. (ලකුණු 05)

08. i. සමාජ සමූහයන්හි කාර්යයන් නම් කරන්න. (ලකුණු 02)

ii. ප්‍රජාව යනු කුමක් දැයි විස්තර කරන්න. (ලකුණු 03)

iii. පුද්ගල එකතුව සමාජයක් නොවේ. විමසන්න. (ලකුණු 05)



www.pirivena.lk

**2566 - මූලික පිරිවෙන් වර්ෂාවසාන විභාගය - 2022(2023)**

**"සිප්සර සවිය" සමාජ විද්‍යා සිසු නිපුණතා සම්මන්ත්‍රණය**
**(සමාජ විද්‍යා ගුරු පවුර)**

**NEW**

**(08) සමාජ විද්‍යාව - I, II**

**08 S I, II**

**(නව නිර්දේශය)**

(පැ තුනයි)

**අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සමාජ විද්‍යාව - I පත්‍රය

**සැලකිය යුතුයි :**

* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.**
* **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
* **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.**

---

*(ලකුණු 01 × 40 = 40 යි)*

1. 19 වන සියවසේ සමාජ විද්‍යාව විෂයය ප්‍රභවය වීම කෙරෙහි කේන්ද්‍රීයව බලපෑම් කළ සමාජය ඇතුළත් වරණය තෝරන්න.
   (1) අප්‍රිකානු සමාජය
   (2) ආසියාතික සමාජය
   (3) ලතින් ඇමරිකානු සමාජය
   (4) බටහිර යුරෝපා සමාජය

2. පුද්ගලයාට හැකි තරම් ධන සම්පත් උත්පාදනය කර ඒ දෙස බලා සිටින දෙවියන් වහන්සේ සතුටු කළ යුතු බව ප්‍රකාශ කලේ කවුද ?
   (1) කාල් මාක්ස් හා මැක්ස් වෙබර් ය.
   (2) ඔගස්ට් කොම්ට් හා කාල් මාක්ස් ය.
   (3) ජෝන් කැල්වින් හා මාටින් ලූතර් ය.
   (4) මාටින් ලූතර් හා කාල් මාක්ස් ය.

3. සමාජ විද්‍යාව විෂය ආරම්භයේ දී ම මුහුණ පෑමට සිදු වූ ප්‍රබල අභියෝගය නම් "සමාජ විද්‍යාව" විද්‍යාත්මක විෂයක් නොවන බවයි. එම අභියෝගය ජය ගැනිමට සමත් සම්භාව්‍ය සමාජ විද්‍යාඥයන් ඇතුළත් පිළිතුර කුමක්ද?
   (1) හැරි එම් ජොන්සන්, එමිල් ඩුර්කයිම් හා මැක්ස් වෙබර් ය.
   (2) එමිල් ඩුර්කයිම්, මැක්ස් වෙබර් හා හර්බට් ස්පෙන්සර් ය.
   (3) මැක්ස් මැක්ස් වෙබර්, රොබට්පාක් හා හර්බට් ස්පෙන්සර් ය.
   (4) රැල්ෆ් ලින්ටන්, හර්බට් ස්පෙන්සර් හා කිංස්ලි ඩේවිස් ය.

4. "සමාජ විද්‍යාව" විෂය ධාරාව ප්‍රථමයෙන්ම සමාජගත වූයේ කුමන නාමයෙන්ද?
   (1) සමාජ භෞතික විද්‍යාව ලෙසයි.
   (2) සමාජ විද්‍යාව ලෙසයි.
   (3) සමාජ මානව විද්‍යාව ලෙසයි.
   (4) මානව චර්යා විද්‍යාව ලෙසයි.

www.pirivena.lk

[ 2 වැනි පිටුව බලන්න.

සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් (අ) තීරුව මගින්ද ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් (ආ) තීරුවෙන්ද දැක්වේ.

| (අ) | (ආ) |
|---|---|
| 1. හර්බට් ස්පෙන්සර් | A. භෞතික බලවේග කෙරෙහි දැඩි විශ්වාසය තැබීය. |
| 2. ඔගස්ට් කොම්ට් | B. සරල සමජාතීය යුධමය හා ආගාදායක බව පැවතීය. |
| 3. කාල් මාක්ස් | C. සමාජ සංස්ථා අධ්‍යයනය කිරීම සමාජ විද්‍යාවයි. |
| 4. එමිල් ඩුර්කයිම් | D. සර්ව සමබර ප්‍රතිවිරෝධතාවයන්ගෙන් තොර සමාජයකි. |

5. ඉහත (අ) තීරුව සමග (ආ) තීරුව නිවැරදිව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A, B, C, D (2) C, D,A, B
(3) B, C, D, A (4) B, A, D, C

6. ආරෝපිත දිසානතික ලක්ෂණ බහුල වශයෙන් දැකගත හැකි සමාජ ක්‍රමය වන්නේ,
(1) නූතන නාගරික සමාජයයි (2) සාම්ප්‍රදායික සමාජයයි
(3) බටහිර සමාජයයි (4) කාර්මික සමාජයයි

7. මානව සමාජයේ ප්‍රභවය, විකාශනය, දියුණුව, පරිහානිය, රාජ්‍ය බිහිවීම, සමාජයේ බෙදීම් හා සමාජ තත්ත්වය පිළිබඳව අර්ථ විවරණය සපයන බෞද්ධ සූත්‍ර දේශනාව නම්,
(1) චක්කවත්තිසිහනාද සූත්‍රයයි (2) පරාභව සූත්‍රයයි
(3) අග්ගඤ්ඤ සූත්‍රයයි (4) වසල සූත්‍රයයි

8. සමාජය තුළ දක්නට ලැබෙන කුල ක්‍රමය සාමාජිකයින් අතර බෙදීම ආරෝපිත හා ස්ථාවර එකක් බව පෙන්වා දෙන ඉගැන්වීම් අන්තර්ගත වනුයේ,
(1) බ්‍රාහ්මණ ආගම තුළ ය (2) පරිබ්‍රාජක ආගම තුළ ය
(3) ජෛන ආගම තුළ ය (4) කතෝලික ආගම තුළ ය

9. සමාජ පරිණාමීය ක්‍රියාවලියේ අපට හමුවන ප්‍රබල ගාමක බලවේගය කුමක්ද?
(1) ආගමික පිබිදීමයි (2) දේශපාලනික පිබිදීමයි
(3) කාර්මික පිබිදීමයි (4) සමාජීය පිබිදීමයි

10. බෞද්ධ සූත්‍ර කිහිපයක් (ආ) තීරුවේද ඉන් පැවසෙන හරය (ආ) තීරුවේද දැක්වේ. ඒවා අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

| (අ) | (ආ) |
|---|---|
| 1. කූටදත්ත සූත්‍රය | A. සමාජ පාලන මූලධර්ම |
| 2. ව්‍යග්ගපජ්ජ සූත්‍රය | B. දොලොව සමාජ ජීවිතය සංවර්ධනය |
| 3. චක්කවත්තිසිහනාද සූත්‍රය | C. ආර්ථික සංවර්ධනය |
| 4. සිඟාලෝවාද සූත්‍රය | D. විධිමත් සමාජ අන්තර් ක්‍රියා |

ඉහත (අ) තීරුව (ආ) තීරුව සමග ගැළපූ විට ලැබෙන නිවැරදි වරණය තෝරන්න.
(1) A, B, C, D (2) C, B, A, D
(3) B, C, D, A (4) D, C, B, A

11. ඔගස්ට් කොම්ට්ගේ ලිබරල්වාදී දාර්ශනික අදහස් වර්ධනයවීම කෙරෙහි බලපෑම් කළේ,
(1) ජෝන් කැල්වින්ගේ ආභාසයයි (2) සෙන්ට් සිමොන්ගේ ආභාසයයි
(3) මාටින් ලූතර්ගේ ආභාසයයි (4) චාල්ස් ඩාවින්ගේ ආභාසයයි

12. සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් විසින් පෙන්වා දුන් සමාජ වර්ග කිරීම්වල ලක්ෂණ කිහිපයක් පහතින් දැක්වේ. ඒවා අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන්න.

A. ප්‍රාථමික සරල සමාජයක් වීම
B. සාරධර්ම පිළිබඳ සැලකිල්ල අඩු වීම
C. නීතිමය පාලනයක් තිබීම
D. පැහැදිලි ශ්‍රම විභජනයක් නොවීම
E. පෞද්ගලික අරමුණු ප්‍රමුඛ වීම
F. පුද්ගල හැකියාව ප්‍රමුඛ වීම

එමිල් ඩුර්කයිම්ගේ සමාජ වර්ග කිරීම තුළ ඓන්ද්‍රිය ඒකාබද්ධතාවය සහිත සමාජයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ ඇතුළත් වරණය කුමක්ද?
(1) A, B, C, D (2) C, D, E, F
(3) B, C, D, E (4) B, C, E, F

www.pirivena.lk

13. ප්‍රංශයේ පැවති වැඩවසම් සමාජ පාලන ක්‍රමය බිඳ දමා ලිබරල්වාදී පාලන ක්‍රමයක් ඇතිකර ගන්නා ලද්දේ,
   (1) 1689 වර්ෂයේ දී ය  (2) 1889 වර්ෂයේ දී ය
   (3) 1789 වර්ෂයේ දී ය  (4) 1989 වර්ෂයේ දී ය

14. "ගමයි පන්සලයි - වැවයි දාගැබයි" යන සංකල්පය මෙරට ජන ජීවිතයට බද්ධ වීම තුළින් පිළිඹිබු කරනුයේ,
   (1) කෘෂි කර්මාන්තය ප්‍රමුඛ වී ඇති බවයි
   (2) ගුවන පරයන දාගැබ් ඉදිකර ඇති බවයි
   (3) මෙරට සංස්කෘතියේ අභිමානය බවයි
   (4) මෙරට ජනයා බොදු හැදියාවෙන් යුක්ත බවයි

15. බෞද්ධයකු වූ සචින්ත බොදු ගීත ගායනා කරමින් හින්දු කෝවිල් භූමියක් වෙත ගියේය. එහිදී හින්දු චාරිත්‍ර අනුව භජන් ගීතිකා ගායනා කරමින් හින්දු දෙවියන් පිදීම සචින්ත විසින් සිදු කරන ලදි. මෙම සංසිද්ධිය තුළින් පැවසෙන සමාජ විද්‍යාත්මක අර්ථය නම්,
   (1) සචින්ත ගීත ගායනා කිරීමට ප්‍රියකරන බවයි.
   (2) සචින්ත සිංහල, දෙමළ භාෂා දෙකම දන්නා බවයි.
   (3) සචින්ත විනෝදයට කැමති අයකු බවයි.
   (4) අන්තර් ආගමික සහජීවනයක් ඇති බවයි.

- ප්‍රශ්න අංක 16-17 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් කරුණු උපයෝගීකර ගන්න.
   A. ධර්මතා  E. විශ්වවිද්‍යාල
   B. යාන වාහන  F. සිරිත් විරිත්
   C. මුඩුක්කු නිවාස  G. අදහස්
   D. සාහිත්‍ය

16. උප සංස්කෘතිය සඳහා නිදසුන් සපයන වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.
   (1) A හා B  (2) C හා D
   (3) B හා C  (4) C හා E

17. අභෞතික සංස්කෘතිකාංග වඩාත් හොඳින් නිරූපිත වරණය ඇතුළත් පිළිතුර තෝරන්න
   (1) A, B හා C  (2) E, F හා G
   (3) C, D හා E  (4) A, G හා F

18. කාර්මීකරණය, නාගරීකරණය, බටහිරකරණය, විද්‍යුත් මාධ්‍ය, අන්තර්ජාලය වැනි සාධක හේතුවෙන් සංස්කෘතියට නවමු ලක්ෂණ ව්‍යාප්ත වීමක් දක්නට ලැබේ. සමාජ විද්‍යා තුළ මෙම සංකල්පය හඳුන්වන්නේ,
   (1) සංස්කෘතික විසරණයයි  (2) සංස්කෘතික ලැග්මයි
   (3) සංස්කෘතික ගැටුමයි  (4) සංස්කෘතික අපගමනයයි

19. කුලය, කළු-සුදු, ස්ත්‍රී- පුරුෂ භාවය, පියාගෙන් පසු රජකම උරුම වීම ආදී සංකල්ප සමාජ විද්‍යාව තුළ වඩාත් හොඳින් විවරණය කරන පිළිතුර තෝරන්න.
   (1) සාධිත දිශානතික සමාජ ලක්ෂණයයි  (2) බහුවිධ දිශානතික සමාජ ලක්ෂණයයි
   (3) ආරෝපිත දිශානතික සමාජ ලක්ෂණයයි  (4) ඒකීය දිශානතික සමාජ ලක්ෂණයයි

20. සරල සමාජ ලක්ෂණ බහුල වශයෙන් දක්නට ලැබෙන සමාජ නම්,
   (1) කාර්මික සමාජයයි  (2) ගැමි සමාජයයි
   (3) නාගරික සමාජයයි  (4) නූතන සමාජයයි

21. සත්තිගුම්භ ජාතක කතාවෙන් හෙළි කරන සමාජ විද්‍යාත්මක අගය නම්,
   (1) පුද්ගල චර්යාවන්ට ආරය බලපාන බවයි.
   (2) පුද්ගල චර්යාවන්ට අභ්‍යන්තර සාධක බලපාන බවයි.
   (3) පුද්ගල චර්යාවන්ට බාහිර සාධක නොවැදගත් බවයි.
   (4) පුද්ගල චර්යාවන්ට පාරිසරික සාධක බලපාන බවයි.

www.pirivena.lk

[ 4 වැනි පිටුව බලන්න.

22. පෘතුගීසීන්, ලන්දේසීන් අභිබවමින් ඉංග්‍රීසීන් විසින් පෙරදිග බලය ලොවපුරා ව්‍යාප්ත කරගනිද්දී ශ්‍රී ලංකාව ඔවුන්ගේ අනසකට නතු වූයේ,
    (1) 1715 වර්ෂයේ දී ය
    (2) 1915 වර්ෂයේ දී ය
    (3) 1815 වර්ෂයේ දී ය
    (4) 1818 වර්ෂයේ දී ය

- අංක 23 හා 24 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන කරුණු උපයෝගී කරගන්න

  A – I ධනාත්මක චිත්තවේග
  II සහජීවනය

  B – I දරිද්‍රතාවය
  II ඉතිරි කිරීම

  C – I බෞද්ධ සමාජ පාලනය
  II සමාජ සංවර්ධනය

  D – I මුඩුක්කු නිවාස
  II ආර්ථික සංවර්ධනය

  E – I සමාජානුයෝජනය
  II සමාජ සංවිධානකාරී බව

  F – I අල්පේච්ඡතාවය
  II පුද්ගල අවශ්‍යතා

23. අංක (I) හි වැඩි වීම, අංක (II) හි වැඩිවීම කෙරෙහි බලපාන සාධක ඇතුළත් වරණය තෝරන්න
    (1) A, C හා E ය
    (2) B, D හා F ය
    (3) A, C හා D ය
    (4) B, E හා F ය

24. අංක (I) හි වැඩි වීම, අංක (II) හි අඩුවීම කෙරෙහි බලපාන සාධක ඇතුළත් වරණය තෝරන්න
    (1) A, C හා E ය
    (2) D, E හා F ය
    (3) B, D හා F ය
    (4) A, C හා D ය

25. මානව සමාජය ප්‍රභවය වීමත් සමග ක්‍රමයෙන් තෘෂ්ණාව, ආහාරයේ ගිජු බව, කාම සේවනය, හොරකම, බොරු කීම, මනුෂ්‍ය ඝාතන යනාදිය පාප සිතුවිලිවල ක්‍රම විකාශය පිළිබඳ තොරතුරු හමුවන ප්‍රබල සූත්‍රය නම්,
    (1) චක්කවත්තිසීහනාද සූත්‍රයයි
    (2) වසල සූත්‍රයයි
    (3) පරාභව සූත්‍රයයි
    (4) අග්ගඤ්ඤ සූත්‍රයයි

26. ඉංග්‍රීසි ආණ්ඩුව විසින් හඳුන්වා දුන් "Village hedman" තනතුර ක්‍රම විකාශනයත් සමග පරිවර්තනය වී වර්තමානයේදී එම තනතුර හඳුන්වනුයේ,
    (1) ග්‍රාම නිලධාරී තනතුර ලෙසය
    (2) ග්‍රාම සංවර්ධන තනතුර ලෙසය
    (3) ග්‍රාම සේවක තනතුර ලෙසය
    (4) බහු කාර්ය සංවර්ධන තනතුර ලෙසය

27. පහත දැක්වෙන කරුණු ඉතා හොඳින් අධ්‍යයනය කරන්න.
    A. සොරකම
    B. පූජනීය දේපලවලට හානි සිදු කිරීම
    C. රාජ්‍ය විරෝධී ක්‍රියා
    D. සාරධර්ම කණ්ඩනය කිරීම
    E. මං මාවත් එළි පෙහෙළි නොකිරීම

    ඉහත කරුණු අතරින් අතීත ශ්‍රී ලංකාවේ රාජාධිකරණය මගින් බරපතළ අපරාධ වශයෙන් සලකනු ලැබූ කරුණු ඇතුළත් වරණය තෝරන්න.
    (1) A, B හා C ය
    (2) C, D හා E ය
    (2) B, C හා D ය
    (4) A, C හා E ය

www.pirivena.lk

28. සමාජ ප්‍රශ්න කිහිපයක් පහත දැක්වෙන අතර ඒ අතරින් සමාජ ප්‍රශ්නයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
   (1) වයස්ගතභාවය අධික වීම
   (2) පුද්ගලයින් මරණයට පත්වීම
   (3) ජනගහන වර්ධනය අධික වීම
   (4) ආත්ම ඝාතනය

29. සමාජය තුළ "අනෝමිය" පරිසරයක් නිර්මාණය වීමෙන් සමාජ ප්‍රශ්න ඇති වන බව එමිල් ඩුර්කයිම්ගේ අදහසයි. ඒ අනුව "අනෝමිය" යන සංකල්පයෙන් අදහස් කරන්නේ,
   (1) අපේක්ෂා බිඳ වැටීම යන්නයි
   (2) තමා තමාට එරෙහි වීම යන්නයි
   (3) සමාජයට එරෙහිව ක්‍රියා කිරීම යන්නයි
   (4) ධර්මතා රහිත තත්ත්වයක් යන්නයි

30. වෙළඳ ප්‍රජාව තුළ පැවති අදැහැමි ක්‍රියා නවතාලීම සඳහා පනවන ලද නීති මාලාවක් බදුලු ටැම් ලිපියේ සඳහන් වන අතර එම නීති අතරින් සාවද්‍ය ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.
   (1) පෙරමඟට ගොස් භාණ්ඩ මිලදී ගැනීම නොකළ යුතුයි
   (2) වෙළඳ මධ්‍යස්ථානයට භාණ්ඩ රැගෙන පැමිණිය ද අලෙවි නොකළේ නම් බදු අය නොකළ යුතුය.
   (3) වෙළඳ මධ්‍යස්ථානය ඔස්සේ භාණ්ඩ ප්‍රවාහනයේ දී බදු අය නොකළ යුතුය.
   (4) බුලත් පුවක් ආදිය තැබීමට වෙනම ම ස්ථානයක් තැබිය යුතුය.

31. සේව්‍ය සේවක දෙපාර්ශවයේ අන්‍යෝන්‍ය ඒකාබද්ධතාවයෙන් යුක්තව ක්‍රියා කිරීමට පරමාදර්ශය සපයන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?
   (1) චක්කවත්තිසීහනාද සූත්‍රය
   (2) ව්‍යග්ගපජ්ජ සූත්‍රය
   (3) සිඟාලෝවාද සූත්‍රය
   (4) අග්ගඤ්ඤ සූත්‍රය

32. පහත සඳහන් කරුණු අධ්‍යයනය කරන්න.
   A. හිංසා වැළකීම
   B. සාමූහිකව ක්‍රියා කිරීම
   C. සත්‍යවාදී බව
   D. කාන්තාවන්ට පීඩා නොකිරීම
   E. පනවා ඇති නීති ආරක්ෂා කිරීම
   F. චර්යා පාරිශුද්ධත්වය

   ඉහත සඳහන් කරුණුවලට අනුව පංචශීලයේ අර්ථ නිරූපණයන් සංක්ෂිප්තව දක්වා ඇති වරණය තෝරන්න.
   (1) A, B හා C ය
   (2) C, D හා E ය
   (3) B, C හා D ය
   (4) A, C හා F ය

33. නූතන සමාජවල වාර්ගික විභේදනය සහිත සමාජ ඒකාබද්ධතාවයක් ගොඩනගා ගැනීම සඳහා පිටිවහල් නොවන වරණය කුමක්ද?
   (1) සියලු ජන වර්ගයන්ට ගරු කිරීම
   (2) සියලු ජනයාට සම අවස්ථා ඇති කිරීම
   (3) සියලු ජනවර්ගයන්ගේ මානව නිදහස ඇති කිරීම
   (4) සියලු සංස්කෘතීන්ට වඩා තම සංස්කෘතිය අගය කිරීම

34. සමාජ විද්‍යා පර්යේෂණ සිදු කිරීමේ මූලික අරමුණ වන්නේ,
   (1) නව දැනුම අනාවරණය කර ගැනීමයි
   (2) සමාජ අපගාමීතාවය හඳුනා ගැනීමයි
   (3) සමාජ ගැටලු හඳුනා ගැනීමයි
   (4) සමාජ පර්යාය හඳුනා ගැනීමයි

35. සමාජීය විද්‍යා පර්යේෂණ සඳහා දත්ත රැස්කිරීමේ දී උපයෝගී කරගත හැකි ක්‍රම කිහිපයක් පහත දැක්වේ.
   **A.** ප්‍රශ්න මාලා
   **B.** පර්යේෂණ නිබන්ධන
   **C.** සම්මුඛ සාකච්ඡා
   **D.** ලිපි ලේඛන
   **E.** නිරීක්ෂණය
   **F.** සඟරා

   ඉහත සඳහන් දත්ත රැස් කිරීමේ ක්‍රම අතර ප්‍රාථමික මූලාශ්‍රය පමණක් ඇතුළත් වරණය කුමක්ද?
   (1) A, B හා C ය
   (2) A, C හා E ය
   (3) B, C හා D ය
   (4) B, D හා F ය

www.pirivena.lk

[ 6 වැනි පිටුව බලන්න.

36. සමාජ විද්‍යා පර්යේෂණයක් සඳහා දත්ත රැස් කිරීමේදී යොදාගත් නිරීක්ෂණ ප්‍රභේදයට අයත් නොවන වරණය තෝරන්න.

(1) ඍජු නිරීක්ෂණ (2) සහභාගිතා නිරීක්ෂණය
(3) වක්‍ර නිරීක්ෂණ (4) සායනික නිරීක්ෂණය

- පහත සඳහන් සිද්ධිය ඇසුරින් ප්‍රශ්න අංක 37 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සමාජ විද්‍යා පර්යේෂණය කිරීම සඳහා උනන්දුවක් දක්වන පඤ්ඤාසාර හිමි එක්තරා දහම් පාසලක් තෝරාගෙන එම දහම් පාසලට නොකඩවා නොපැමිණෙන සිසුන්ගේ තොරතුරු ඇතුළත් වාර්තාවක් ලබා දෙන ලෙස ප්‍රධානාචාර්ය ස්වාමින් වහන්සේ වෙත දැනුම් දෙන ලදි. එසේ දැනුම් දීමෙන් අනතුරුව උන්වහන්සේ ශිෂ්‍ය පැමිණීමේ නාම ලේඛන අධීක්ෂණය කොට නොකඩවා දහම් පාසලට නොපැමිණෙන සිසුන් දස දෙනෙකුගේ තොරතුරු ඇතුළත් වාර්තාවක් පිළියෙළ කොට ලබා දුන්හ. පසුව ස්වාමින් වහන්සේලා දෙනම ම දෙමාපියන් දැනුවත් කොට වේලාවක් හා දිනයක් ද ලබාදී ඔවුන් හමුවීම තම තමන්ගේ නිවස තුළදී ම සිදු විය. දහම් පාසලට දරුවන් නොපැමිණීම පිළිබඳව දෙමාපියන් සමග පළමුව සාකච්ඡා කොට දෙවනුව දරුවන් සමඟ ද සාකච්ඡා කළේය. සාකච්ඡා කටයුතු පැවැත්වෙන අතරම ඔවුන්ගේ භෞතික සම්පත් සියල්ල නිරීක්ෂණය කළේය. එම සාකච්ඡාවලින් හා නිරීක්ෂණයෙන් අනතුරුව ළමුන් දහම් පාසලට දිනපතාම නොපැමිණීමේ ගැටලුවට අදාළ සියලුම තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි විය.

37. සමාජීය විද්‍යා පර්යේෂකයෙකු අක්ෂර හැකියාව නොමැති සමාජ කණ්ඩායමකින් තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීම යනු ප්‍රශ්නාවලියේ,

(1) වාස්තවික බව හා සම්බන්ධ දෝෂයකි
(2) වලංගුතාව සම්බන්ධ දෝෂයකි
(3) ප්‍රායෝගික බව හා සම්බන්ධ දෝෂයකි
(4) විශ්වසනීයතාව පිළිබඳ දෝෂයකි

38. පඤ්ඤාසාර හිමියන් තම පර්යේෂණය සඳහා තෝරාගත් කණ්ඩායම හඳුන්වන නාමය වන්නේ,

(1) නියදිය වශයෙනි
(2) ජනගහනය වශයෙනි
(3) කණ්ඩායම වශයෙනි
(4) දහම් පාසලේ ශිෂ්‍ය ප්‍රජාව වශයෙනි

39. පර්යේෂකයා දත්ත රැස් කිරීම සඳහා භාවිතා කළ නිරීක්ෂණ ප්‍රභේද වන්නේ,

(1) සහභාගිත්ව නිරීක්ෂණය හා වක්‍ර නිරීක්ෂණයයි
(2) ඍජු නිරීක්ෂණය හා වක්‍ර නිරීක්ෂණයයි
(3) සහභාගිත්ව නිරීක්ෂණය හා ඍජු නිරීක්ෂණයයි
(4) සායනික නිරීක්ෂණය හා සහභාගිත්ව නිරීක්ෂණයයි

39. දත්ත රැස් කිරීම සඳහා භාවිතා කළ සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණය මගින් ගැටලුවට අදාළ සියලුම තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි විය. දත්ත රැස්කිරීමේ මෙම ගුණාංගය හඳුන්වනුයේ,

(1) වාස්තවික බව ලෙස හැඳින්වේ
(2) විශ්වසනීයතාව ලෙස හැඳින්වේ
(3) ප්‍රායෝගික බව ලෙස හැඳින්වේ
(4) වලංගුතාව ලෙස හැඳින්වේ

**අනුර සෝමසිරි**
**BA, PGDE, MED**
**සමාජීය විද්‍යා ගුරු උපදේශක, උත්තර පත්‍ර පරීක්ෂක**

පරිගණක සංස්කරණය - කුමුදු ජානක විජයතිලක
බප/ මීනු/ සරස්වතී මහ පිරිවෙන - බලගල්ල



www.pirivena.lk

# 2566 - මූලික පිරිවෙන් වර්ෂාවසාන විභාගය - 2022(2023)

**"සිප්සර සවිය" සමාජ විද්‍යා සිසු නිපුණතා සම්මන්ත්‍රණය**
**(සමාජ විද්‍යා ගුරු පවුර)**

**NEW** **08 S I, II**

## (08) සමාජ විද්‍යාව - I, II

(පැ තුනයි)

### සමාජ විද්‍යාව - II පත්‍රය

* පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) මානව සමාජය පිළිබඳව අධ්‍යයනය කළ හැකි විෂයයන් දෙකක් නම් කරන්න.
   (ii) සමාජ විද්‍යාව විෂය සංවර්ධනයට එමිල් ඩුර්කයිම් විසින් හඳුන්වා දෙන ලද සංකල්ප දෙකක් ලියන්න.
   (iii) බුදු දහමට අනුව මානවයා විසින් අත්පත් කරගත යුතු දියුණුවේ ප්‍රභේද දෙක නම් කරන්න.
   (iv) මානව පවුල තුළින් අපේක්ෂා කරන ප්‍රධාන කාර්යයන් දෙකක් නම් කරන්න.
   (v) සම වයස් මිත්‍ර කණ්ඩායම් ඇසුරු කිරීම තුළින් ලද හැකි ධනාත්මක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
   (vi) මහජනයා වෙනුවෙන් පොලිසිය විසින් ඉටු කරනු ලබන සේවාවන් දෙකක් ලියන්න.
   (vii) බෞද්ධ සමාජය තුළ දක්නට ලැබෙන ප්‍රධාන වර්ගකිරීම් දෙක නම් කරන්න.
   (viii) ආර්ථික දරිද්‍රතාවයට මුහුණ දෙන ජනයා ඉන් මුදවා ගැනීම උදෙසා ශ්‍රී ලංකා ආණ්ඩු මගින් අනුගමනය කළ ක්‍රියා මාර්ග දෙකක් සඳහන් කරන්න.
   (ix) සමාජ ප්‍රශ්න ඇතිවීම කෙරෙහි බලපාන සාධක දෙකක් නම් කරන්න.
   (x) HIV / ඒඩ්ස් රෝගීන් වෙනුවෙන් ආරක්ෂා වීමට පුද්ගලයාට අනුගමනය කල හැකි ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.

(ලකුණු 02 X 10 = 20 යි)

2. (i) සමාජ විද්‍යාව යනු කුමක්දැයි අර්ථ දක්වන්න. (ලකුණු 02 යි)
   (ii) සමාජ විද්‍යාවේ ප්‍රගමනය උදෙසා මැක්ස් වෙබර්ගෙන් සිදු වූ සේවාවන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   (iii) සංවිධානාත්මක සමාජයක් කරා ගමන් කිරීම සඳහා බෞද්ධ සමාජ විද්‍යාවේ උපයෝගීතාව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

3. (i) සමාජ පරිනාමය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02 යි)
   (ii) "නාගරීකරණය තුළ සමාජයට හිතකර හා අහිතකර බලපෑම් ඇති කරයි" මෙම ප්‍රකාශයට අනුව සමාජයට ඇතිකරන හිතකර බලපෑම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   (iii) දැහැමි රාජ්‍ය පාලනයක් ගොඩනගා ගැනීමට පාලකයා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග බෞද්ධ ඉගැන්වීම් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

4. (i) බෞද්ධ හා හින්දු යන සංස්කෘතීන්වල දක්නට ලැබෙන පොදු ලක්ෂණ එක බැගින් ලියන්න. (ලකුණු 02 යි)
   (ii) හින්දු සමාජය තුළ පූජනීයත්වය පත් වන දෙවිවරුන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03 යි)
   (iii) සමාජය වෙනස් වීම කෙරෙහි සංස්කෘතික සම්පර්කය බලපාන ආකාරය කරුණු දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[ 8 වැනි පිටුව බලන්න.

www.pirivena.lk

5. (i) දුෂ්සමාජානුයෝජනය නිසා පුද්ගලයා තුළ හඳුනාගත හැකි ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02 යි)
(ii) අපරාධවල ස්වභාවය අනුව ඒවා වර්ග කළ හැකි ආකාරයන් තුන සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) නූතන සමාජ තුළ අපරාධවල වර්ධනයක් පෙන්නුම් කරන අතර ඒවා නිරාවරණය කර ගැනිම උදෙසා බෞද්ධ පංචශීලය යොදාගත හැකි බව කරුණු දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

6. (i) නූතන සමාජ පාලනයේදී උපයෝගී කරගන්නා විධිමත් සමාජ පාලන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) ආධිපත්‍ය සූත්‍රයේ දැක්වෙන හොඳ නරක පිළිබඳ ආධිපත්‍ය සංකල්ප තුන නම් කරන්න. (ලකුණු 03 යි)
(iii) පවුල් සංස්ථාව තුළ උද්ගත වන ගැටුම් අවම කර ගැනීම සඳහා සිගාලෝවාද සූත්‍රය යොදාගත හැකි අයුරු කරුණු දෙකක් යොදාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

7. (i) මත්ද්‍රව්‍ය භාවිතය තුළින් පුද්ගලයාට මුහුණ දීමට සිදුවන ගැටලු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) එමිල් ඩුර්කයිම් පෙන්වා දුන් ආත්ම ඝාතන ස්වභාවයේ අංශ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) කතෝලික ආගමේ දස පනත මඟින් ස්වයං පාලනයක් ගොඩනගා ගැනීමට ඉවහල් වන අයුරු කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

8. (i) සමාජ විද්‍යා පර්යේෂණ සඳහා දත්ත රැස්කිරීමේදී යොදාගන්නා ප්‍රධාන මූලාශ්‍ර දෙක නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී පන්ති කාමරය තුළ අනුගමනය කළ හැකි සැලසුම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) සමාජ විද්‍යා පර්යේෂණයකින් ලද හැකි ප්‍රයෝජන කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 03 යි)

**

**අනුර සෝමසිරි**
**BA, PGDE, MED**
**සමාජීය විද්‍යා ගුරු උපදේශක, උත්තර පත්‍ර පරීක්ෂක**

පරිගණක සංස්කරණය - කුමුදු ජානක විජයතිලක
බප/ මිනු/ සරස්වතී මහ පිරිවෙන - බලගල්ල

www.pirivena.lk

## මූලික පිරිවෙන් පළමුවාර / මධ්‍යවාර / වර්ෂාවසාන විභාගය - 20.......

### බහුවරණ උත්තර පත්‍රය/பல்தேர்வு விடைத்தாள்/MCQ Answer Sheet

විෂයය සහ විෂය අංකය
பாடமும் பாட எண்ணும்
Subject and Subject No.

මාධ්‍යය
மொழிமூலம்
Medium

විභාග අංකය
சுட்டெண்
Index No.

.......................................................................................
විභාග අංකය හා අනිකුත් තොරතුරු නිවැරදි බවට නිරීක්ෂකගේ අත්සන හා දිනය
சுட்டெண்ணும் ஏனைய விபரங்களும் சரியானவை என்பதற்கான நோக்குனரின் கையொப்பமும் திகதியும்
Invigilator's signature and date for correct Index Number and other details

| | | | |
|---|---|---|---|
| 1 ① ② ③ ④ ⑤ | 11 ① ② ③ ④ ⑤ | 21 ① ② ③ ④ ⑤ | 31 ① ② ③ ④ ⑤ |
| 2 ① ② ③ ④ ⑤ | 12 ① ② ③ ④ ⑤ | 22 ① ② ③ ④ ⑤ | 32 ① ② ③ ④ ⑤ |
| 3 ① ② ③ ④ ⑤ | 13 ① ② ③ ④ ⑤ | 23 ① ② ③ ④ ⑤ | 33 ① ② ③ ④ ⑤ |
| 4 ① ② ③ ④ ⑤ | 14 ① ② ③ ④ ⑤ | 24 ① ② ③ ④ ⑤ | 34 ① ② ③ ④ ⑤ |
| 5 ① ② ③ ④ ⑤ | 15 ① ② ③ ④ ⑤ | 25 ① ② ③ ④ ⑤ | 35 ① ② ③ ④ ⑤ |
| 6 ① ② ③ ④ ⑤ | 16 ① ② ③ ④ ⑤ | 26 ① ② ③ ④ ⑤ | 36 ① ② ③ ④ ⑤ |
| 7 ① ② ③ ④ ⑤ | 17 ① ② ③ ④ ⑤ | 27 ① ② ③ ④ ⑤ | 37 ① ② ③ ④ ⑤ |
| 8 ① ② ③ ④ ⑤ | 18 ① ② ③ ④ ⑤ | 28 ① ② ③ ④ ⑤ | 38 ① ② ③ ④ ⑤ |
| 9 ① ② ③ ④ ⑤ | 19 ① ② ③ ④ ⑤ | 29 ① ② ③ ④ ⑤ | 39 ① ② ③ ④ ⑤ |
| 10 ① ② ③ ④ ⑤ | 20 ① ② ③ ④ ⑤ | 30 ① ② ③ ④ ⑤ | 40 ① ② ③ ④ ⑤ |

වැරදි ප්‍රතිචාර සංඛ්‍යාව
பிழையான துலங்கல்களின் எண்ணிக்கை
No.of incorrect responses

උත්තර පත්‍ර පරීක්ෂක සංකේත අංකය හා අත්සන/
விடைத்தாள் பரீட்சகரின் குறியீட்டெண்ணும் ஒப்பமும்/
Code No. and Signature of Marking Examiner

1.
2.
3.

ඇගයීම් ලකුණු සටහනට ඊළඟ පරීක්ෂා සඳහා
கணிப்புப் பரீட்சகருக்காக
For E.M.F.

නිවැරදි ප්‍රතිචාර සංඛ්‍යාව
சரியான துலங்கல்களின் எண்ணிக்கை
No.of correct responses